SRI LANKA
histories that connect
සබැඳි ඉතිහාසය
இணைந்த வரலாறுகள்

# ඉතිහාස පන්ති කාමරය තුළ හේතුඵල සම්බන්ධය පිළිබඳ විචාරාත්මක චින්තනය වර්ධනය කිරීම සඳහා ගුරු මාර්ගෝපදේශය




COLLECTIVE FOR HISTORICAL DIALOGUE & MEMORY
EuroClio
Inspiring History and Citizenship Educators
SCOPE
Strengthening Social Cohesion and Peace in Sri Lanka
Co-funded by the European Union
german cooperation
DEUTSCHE ZUSAMMENARBEIT
Implemented by:
giz Deutsche Gesellschaft für Internationale Zusammenarbeit (GIZ) GmbH

# ACKNOWLEDGEMENTS


**Authors**

Bridget Martin, Judith Perera



**Published by**

EuroClio - European Association of History Educators as part of the project *Histories that Connect Sri Lanka II*



**Copyright**

CC BY 4.0



**To cite this publication:**

Martin, B., Perera, J. (2024). Developing Critical Thinking about Cause and Consequence in the History Classroom. *EuroClio - European Association of History Educators*.

**Supported by**

*This publication was supported by the Strengthening Social Cohesion and Peace in Sri Lanka (SCOPE) programme. SCOPE is co-funded by the European Union and the German Federal Foreign Office and implemented by GIZ in partnership with the Government of Sri Lanka. The content of the publication does not represent the official position of the European Union, the German Federal Foreign Office, GIZ, or the Government of Sri Lanka.*

# 1.

# ඉතිහාස පන්ති කාමරය තුළ හේතු සහ ප්‍රතිවිපාක පිළිබඳ හැඳින්වීම



# 1අ. එසේ හඳුන්වන්නේ කුමක් ද?

හේතුව සහ ප්‍රතිවිපාකය යනු ඉතිහාස පන්ති කාමරයට ඉතා වැදගත් විශ්ලේෂණ මෙවලමකි. ඉතිහාසඥයන් අතීතයේ සිදු වූයේ කුමක්ද යන්න මෙන්ම එම සිදුවීම් සිදු වූයේ ඇයි හෝ කෙසේද යන්න පිළිබඳව මෙහිදී ප්‍රශ්න කරයි. ඓතිහාසික සිදුවීම් විශ්ලේෂණය කිරීමේ දී, බොහෝ විට එම සිදුවීමට තුඩු දුන් විවිධ සාධක (හේතූන්) පෙළක් මෙන්ම, එම සිදුවීමෙන් ඇති වූ විවිධ ප්‍රතිඵල හෝ බලපෑම් (ප්‍රතිවිපාක) පෙළක් හඳුනා ගත හැකිය. මෙම සංකල්ප ඵලදායී ලෙස සිසුන්ට අවබෝධ කර දීම සඳහා ඉතිහාස පන්ති කාමරය තුළ විවිධ උපාය මාර්ග භාවිත කිරීම පිළිබඳව සිතා බැලීම වැදගත් වේ.

ඉතිහාස පන්ති කාමරය තුළ සලකා බැලිය හැකි විවිධ වර්ගයේ හේතු සහ ප්‍රතිවිපාක තිබේ. පළමු වර්ගය කාලානුක්‍රමය හෝ අනුපිළිවෙල සමඟ සම්බන්ධ වේ. මෙය කෙටි කාලීන, මධ්‍ය කාලීන හෝ දිගු කාලීන හේතු සහ ප්‍රතිවිපාකවල ස්වරූපය ගත හැකිය. දෙවන වර්ගය හේතු සහ ප්‍රතිවිපාකවල ස්වභාවයට සම්බන්ධ වේ. ඉතිහාසඥයින් හේතු සහ ප්‍රතිවිපාක ධනාත්මක හෝ සෘණාත්මක ද යන්න සලකා බලා ඒවායේ වැදගත්කම ඇගයීමට ලක් කරයි. හේතු සහ ප්‍රතිවිපාක දේශපාලන, සමාජීය, දෘෂ්ටිවාදී හෝ ආර්ථික වැනි පැතිකඩ හරහා ද විශ්ලේෂණය කළ හැකිය.

එක් එක් ප්‍රභේදයට සුවිශේෂී වූ හේතු සහ ප්‍රතිවිපාක ආකාරයන් ද තිබේ. හේතු පිළිබඳ විශේෂයෙන් සලකා බැලීමේ දී, ඉතිහාසඥයින් යම් සිදුවීමක් අවුලුවාලන (උද්දීපනය කරන), එම සිදුවීමට යටින් පවතින හේතු හෝ උත්ප්‍රේරකවල බලපෑම ඇගයීමට ලක් කරයි. නිදසුනක් වශයෙන්, පළමුවන ලෝක යුද්ධයේ ආරම්භය ගැන සාකච්ඡා කිරීමේ දී, එයට හේතු වූ යටින් පැවති හේතු ලෙස මිලිටරිවාදය, සන්ධාන, අධිරාජ්‍යවාදය සහ ජාතිකවාදය යන හේතු තිබූ බවටත්, එහි උත්ප්‍රේරකය වූයේ අගරදගුරු ෆර්ඩිනන්ඩ්ට වෙඩි තැබීම බවටත් ඉතිහාසඥයින්ට තර්ක කළ හැකිය. ප්‍රතිවිපාක පිළිබඳ විශේෂයෙන් සලකා බැලීමේ දී ඉතිහාසඥයන් අපේක්ෂිත හෝ අනපේක්ෂිත ප්‍රතිවිපාක විශ්ලේෂණය කරයි. නිදසුනක් වශයෙන්, පළමු ලෝක යුද්ධයේ ප්‍රතිවිපාක විශ්ලේෂණය කරන විට, වර්සායිල් ගිවිසුම මගින් ජර්මනිය හමුදාකරණය කර යුරෝපයේ සාමය ඇති කිරීමට අදහස් කළ බවට ඉතිහාසඥයින්ට තර්ක කළ හැකිය. කෙසේ වෙතත්, වර්සායිල් ගිවිසුමේ අනපේක්ෂිත ප්‍රතිවිපාකයක් වූයේ ෆැසිස්ට්වාදීන්ගේ සහ නාසි පක්ෂයේ නැගී සිටීමට තුඩු දුන් ජර්මනියේ අස්ථාවරත්වයයි. ප්‍රතිවිපාක තනි පුද්ගලයන්ට සහ පුද්ගල කණ්ඩායම්වලට විවිධ ආකාරවලින් බලපෑවේ කෙසේද යන්න ඉතිහාසඥයින් විමර්ශනය කරන අතර, සිදුවීම්වල හේතු සහ ප්‍රතිවිපාක පිළිබඳ ඓතිහාසික දෘෂ්ටිකෝණයන් පරාසයක් ඔස්සේ විමර්ශනය කරයි.

# 1ආ. එය වැදගත් වන්නේ ඇයි?

හේතු සහ ප්‍රතිවිපාක විශ්ලේෂණය කිරීම වැදගත් වන්නේ එය ඉතිහාස පන්ති කාමරය තුළ විවේචනාත්මක චින්තනය වැඩි දියුණු කරන බැවිනි. ඓතිහාසික සිදුවීම්වල හේතු සහ ප්‍රතිවිපාක විශ්ලේෂණය කිරීමට සිසුන්ට හැකි වූ විට, ඔවුන්ගේ ඉගෙනුම් කටයුතුවල දී සරල කටපාඩම් කිරීමෙන් ඔබ්බට ගොස් මෙම සිදුවීම් පිළිබඳව උසස් විශ්ලේෂණාත්මක චින්තනයකට යාමට ඔවුන්ට හැකි වේ. ඓතිහාසික සිදුවීම් හුදෙකලාව සිදු නොවේ, එම නිසා හේතු සහ ප්‍රතිවිපාක පිළිබඳව නොසලකා හරිමින් ඓතිහාසික සිදුවීම් සිසුන්ට ඉගැන්වීම සිදු නොකළ යුතුය. ඓතිහාසික සිදුවීම්වල හේතු සහ ප්‍රතිවිපාක, කාලය සහ තේමාවන්හි පුළුල් රාමු තුළ මුල් බැස ගනී. ඉතිහාස පන්ති කාමරය තුළ ශිෂ්‍ය චින්තනය ඉහළ නැංවීම සඳහා, සිදු වූයේ කුමක්ද, එය සිදු වූයේ කුමක් නිසාද හෝ කෙසේද සහ එයින් ඇති වූ ප්‍රතිඵලය කුමක්ද යන්න අවබෝධ කර ගැනීම ඉතා වැදගත් වේ. හේතූන් සහ ප්‍රතිවිපාක සම්බන්ධයෙන් දැන ගැනීමෙන්, ඓතිහාසික සිදුවීම්වලට තුඩු දුන් හේතු සහ එම සිදුවීම්වලින් ඇති වූ ප්‍රතිඵල හඳුනා ගැනීමට, තේරුම් ගැනීමට, විශ්ලේෂණය කිරීමට සහ ඇගයීමට සිසුන්ට හැකි වේ. හේතු සහ ප්‍රතිවිපාක තේරුම් ගැනීමට හැකි වීමෙන් සිසුන් ඔවුන්ගේ විවේචනාත්මක චින්තනය වර්ධනය ගන්නා අතර එමඟින් ඔවුන්ගේ ඉතිහාසය පිළිබඳ ලිවීමේ කුසලතා ද වර්ධනය වේ.

විවේචනාත්මක විශ්ලේෂණය මෙන්ම හේතු සහ ප්‍රතිවිපාක ඇගයීම ඉතිහාස විෂය ශික්ෂණයේ මූලික අංගයක් වේ, එබැවින් ඉතිහාස පන්ති කාමරවල දී මෙම කොටස් දෙකටම එක හා සමාන වැදගත් තැනක් ලැබිය යුතුය. ශිෂ්‍යයන්ගේ දැනුම ඇගයීම, බොහෝ දුරට කටපාඩම් කිරීම මත රඳා පවතින අධ්‍යාපන පද්ධතිවල පවා විවේචනාත්මක චින්තනයට ඉමහත් වටිනාකමක් ඇත. සංජානන විද්‍යාඥයන් පෙන්වා දී ඇත්තේ, අප ඉතා වෙහෙස මහන්සි වී උත්සාහ කළත්, අපට සම්බන්ධයක් නොමැති බවක් පෙනෙන හෝ අපට එතරම් තේරුමක් නැති කරුණු සහ විස්තර මතක තබා ගැනීමට අපට අපහසු බවයි; ඒ වෙනුවට, අප ගැඹුරින් සිතූ සහ අපට තේරුමක් ඇති දේවල් මතක තබා ගැනීම, අපට ඉතා සාර්ථක ලෙස කළ හැකි බවයි. 1මේ අනුව, ඉතිහාසයේ හේතු සහ ප්‍රතිවිපාක ගැන විවේචනාත්මකව සිතීමට සිසුන් පෙළඹවීම, ඉතිහාසය පිළිබඳව අවබෝධය සහ කුසලතා වර්ධනය කිරීමේ ප්‍රධාන අංගයක් වන අතර, එමගින් වැදගත් තොරතුරු මතකයෙ රඳවා ගැනීමට සිසුන්ට උපකාර කිරීමේ දී සැලකිය යුතු වාසි ලැබේ.

# 2.

# විවිධ වර්ගයේ ප්‍රශ්න ඇසුරෙන් හේතුව සහ ප්‍රතිවිපාක පිළිබඳ විවේචනාත්මක චින්තනය වර්ධනය කිරීම



සිසුන්ගෙන් අප ප්‍රශ්න අසන විට විවිධ ඉලක්ක මනසේ තබාගෙන එය සිදු කළ හැකිය. මෙම කොටසේ දී අපි ශිෂ්‍යයින් සඳහා විවිධ චින්තන ක්‍රම සහ ගුරුවරුන් සඳහා ශිෂ්‍ය ඉගෙනීම පිළිබඳ විවිධ තොරතුරු ලබා ගැනීමට භාවිත කළ හැකි ප්‍රශ්න වර්ග හතරක් දෙස අවධානය යොමු කරමු. එක් ප්‍රශ්නයකින් එක අරමුණකට වඩා ඉටු කර ගත හැකි බැවින් මෙම ප්‍රශ්න වර්ග සමහර විට එකට එකක් අතිච්ඡේදනය වේ. කෙසේ වෙතත්, ගුරුවරුන් පන්ති කාමරය තුළ විවිධ ප්‍රශ්න ඇසීමේ ඉලක්කය සලකා බැලීම සහ සිසුන් සමඟ ප්‍රශ්න වර්ග පෙළක් භාවිත කරමින් විවිධ ආකාරයේ චින්තනයන් වර්ධනය කිරීම වැදගත් වේ.

## 1අ. අවබෝධය පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්න

සිසුන්ට ඔවුන්ගේ විවේචනාත්මක චින්තනය ගොඩනැගීම සඳහා අවශ්‍ය මූලික පදනමක් ලැබී ඇති බව සහතික කිරීම සඳහා, සිසුන් මූලික තොරතුරු තේරුම් ගෙන ඇත්දැයි පරීක්ෂා කළ හැකි ප්‍රශ්න අත්‍යවශ්‍ය වේ. නිදසුනක් වශයෙන්, සිදුවීම්වල මූලික කාලානුක්‍රමය, අත්‍යවශ්‍ය සහ නිසැක කරුණු, මූලාශ්‍රවල ප්‍රකාශිත අදහස් යනාදිය පිළිබඳ පැහැදිලි සහ නිවැරදි අවබෝධයකින් තොරව සිසුන්ට හේතු සහ ප්‍රතිවිපාක විශ්ලේෂණය කිරීමට සහ ඇගයීමට නොහැකිය. පෙළපොතක් හරහා, ප්‍රාථමික මූලාශ්‍රයකින් හෝ වෙනත් ක්‍රමයක් හරහා ලබා දී ඇති එවැනි තොරතුරු සිසුන් තේරුම් ගෙන තිබේද සහ/හෝ මතක තබා ගෙන තිබේද යන්න පරීක්ෂා කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමේ දී, ගුරුවරයාට සිසුන්ගේ අවබෝධය පරීක්ෂා කරන ප්‍රශ්න ප්‍රයෝජනවත් වේ. මෙම ප්‍රශ්න ඇසුරෙන් ගුරුවරුන්ට, සිසුන්ගේ කිසියම් වරදවා වටහාගැනීම් ඇත්නම් ඒවා නිවැරදි කිරීම සිදු කළ හැකිය. එසේම ශිෂ්‍ය දැනුමේ හිදැස් හඳුනා ගනිමින් ඒවා පුරවමින් සිසුන්ට වඩාත් සංකීර්ණ කාර්යයන් ප්‍රගතියකින් යුතුව සිදු කිරීම සඳහා උපකාර කිරීමට මෙම ප්‍රශ්න වැදගත් වේ.

ඇතැම් ඉතිහාස පන්ති කාමරවල සිසුන්ගෙන් ප්‍රශ්න ඇසීම, අවබෝධය පරීක්ෂා කිරීම අරමුණු කරගත් මෙවැනි ප්‍රශ්නවලට පමණක් සීමා වේ. නමුත් එමඟින් ඉතිහාසය යනු අතීතය පිළිබඳ වූ ආඛ්‍යාන සහ පැහැදිලි කිරීම් පිළිබඳ විවාදාත්මක, සංකීර්ණ සහ බහුවිධ දෘෂ්ටිකෝණයක් සහිත විෂයක් ලෙස විනා, එය කරුණු සහ 'හරි' හෝ 'වැරදි' පිළිතුරු මත පදනම් වූ විෂයක් බව සිසුන් අතර හැඟීමක් ඇති කළ හැකි බැවින් මෙය ගැටලු සහගතය. එබැවින්, අවබෝධය පරීක්ෂා කිරීම අරමුණු කරගත් ප්‍රශ්නවලට අප සීමා නොවී සිටීම වැදගත් වේ. කෙසේ නමුත් මෙම ප්‍රශ්න වැඩිදුර ඉගෙනීම සඳහා අත්‍යවශ්‍ය ආරම්භක ලක්ෂ්‍යයක් ලෙස පවතින බැවින් ඒවා මඟ හැරිය යුතු බව මින් අදහස් නොවේ.

[1] Daniel T. Willingham, Why Don't Students Like School?, Jossey-Bass: San Francisco, 2009.

අවබෝධය පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්නවලට උදාහරණ:

- 1453 දී කොන්ස්තන්තිනෝපලය යටත් කරගත්තේ කවුරුන් විසින් ද?
- හතරවන උදය රජු විසින් වෙළඳපොළ සඳහා හඳුන්වා දුන් නීති සහ රීති මොනවාද?
- පෘතුගීසි දේශ ගවේෂකයන් මුලින්ම ලංකාවට පැමිණියේ කවදා ද?
- පළමු වැනි බුවනෙකබාහු රජුගේ පාලන මධ්‍යස්ථානය පිහිටා තිබුණේ කොහෙද?
- මෙම මූලාශ්‍රයට අනුව ගොවීන් රජු සමඟ නොසතුටින් සිටියේ ඇයි?

අවබෝධය පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්න රටාවන්වලට උදාහරණ:

අවබෝධය පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්නවල දී බොහෝ විට මෙවැනි ප්‍රශ්නවාචී පද භාවිත කරනු ලැබේ:

- කවුද...?
- කුමක්ද...?
- කවදාද...?
- කොහෙද...?
- ඇයි...?

සිසුන්ගේ අවබෝධය පරීක්ෂා කිරීමට සඳහා වූ ප්‍රශ්න ආරම්භ විය හැකි වෙනත් ආකාර කිහිපයක්...

- ....... ඔබේම වචනවලින් ඔබ විස්තර කරන්නේ කෙසේද? (ශිෂ්‍යයන්ට අනුවර්තනය කිරීමට සහ/හෝ සාරාංශ කිරීමට ලබා දීම )
- ....... පිළිබඳව ඔබට උදාහරණයක් දිය හැකිද?
- මූලාශ්‍රයට අනුව, ......... යනු කුමක්ද / ......... සිදු වූයේ ඇයි?

# 2ආ. විශ්ලේෂණය සඳහා සඳහා යොමු කරන ප්‍රශ්න

හේතු සහ ප්‍රතිවිපාක 'විශ්ලේෂණය' කරන ලෙස අපි සිසුන්ට කියා සිටින්නේ නම්, එයින් අපි අදහස් කරන්නේ විවිධ සාධක සහ බලපෑම් අතර සම්බන්ධතා සමීපව පරීක්ෂා කිරීමට, විසංයෝජනය කිරීමට සහ හඳුනා ගැනීමට ය. අදහස්, ගැටලු හෝ සිද්ධීන් ඒවායේ සංඝටක කොටස්වලට කැඩීම, එක් එක් කොටසෙහි ස්වභාවය විමර්ශනය කිරීම සහ ඒවා සියල්ල එකට ගැළපෙන ආකාරය හොඳින් සලකා බැලීම විශ්ලේෂණය ලෙස අපට සිතිය හැක.

විවිධ හේතු වර්ග (දිගු කාලීන හේතු, කෙටි කාලීන හේතු, යටින් පවතින හේතු, උත්ප්‍රේරක යනාදී) වර්ගීකරණය කිරීම සඳහා උපකාර කිරීමට සිසුන්ගෙන් ප්‍රශ්න ඇසීම, නැතහොත් එකිනෙකට වෙනස් ප්‍රතිවිපාක එකිනෙකට සම්බන්ධ වන ආකාරය ගවේෂණය කරන ලෙස ඔවුන්ට කියා සිටීම, විශ්ලේෂණයට ඇතුළත් විය හැකිය. විශ්ලේෂණයේ දී, මූලාශ්‍ර හෝ පුරාවිද්‍යාත්මක සාක්ෂි විශ්ලේෂණය කර ඒවා සාක්ෂි ලෙස පරීක්ෂා කිරීම සඳහාත්, අතීතය පිළිබඳ නිගමනවලට එළඹීමට අපට උපකාර කිරීම සඳහාත් මෙම සලකුණු එකට ගැළපෙන ආකාරය සලකා බැලීම සඳහා යොමු කිරීම සිදු විය හැකිය. අවසාන වශයෙන්, විශ්ලේෂණය සිදු කිරීමේ දී එයට විවිධ මූලාශ්‍ර, හේතූන් හෝ ප්‍රතිවිපාක සංසන්දනය කිරීම සහ අසමානතා දැක්වීම ද ඇතුළත් විය හැකිය.

## හේතුව සහ ප්‍රතිවිපාක විශ්ලේෂණය සඳහා යොමු කරන ප්‍රශ්නවලට උදාහරණ:

- ඔබ දිගු කාලීන හේතූන් ලෙස වර්ග කරන්නේ මින් කුමන හේතු ද? ඔබ කෙටි කාලීන හේතු ලෙස වර්ග කරන්නේ කරන්නේ මින් කුමන හේතු ද? ඔබ එසේ වර්ග කරන්නේ ඇයි?
- අපේක්ෂා නොකළ ප්‍රතිවිපාකයක් වන්නට ඇතැයි ඔබ සිතන්නේ මින් කුමක්ද? ඔබ එසේ සිතන්නේ ඇයි?
- ගැටුමට පාදක වූ හේතු සම්බන්ධයෙන් මෙම මූලාශ්‍ර දෙක එකඟ නොවන්නේ ඇයි?
- මෙම කාල වකවානුවේ පැවති තාක්ෂණය පිළිබඳව, මෙම භූමියෙන් සොයා ගත් ශිලා ලේඛන සහ ලෝහමය වස්තූන්ගෙන් අදහස් කරන්නේ කුමක්ද?
- ආසියාවේ මුල් පෘතුගීසි දේශ ගවේෂණ, කලාපයේ අනෙකුත් යුරෝපීය බලවතුන් විසින් සිදු කරගෙන ගිය දේශ ගවේෂණ සහ ජනපද පිහිටුවීමට දායක වූයේ කෙසේද?
- ආසියාව තුළ සිදු කළ මුල් කාලීන පෘතුගීසි දේශ ගවේෂණය, කලාපයේ අනෙකුත් යුරෝපීය බලවතුන් විසින් සිදු කළ දේශ ගවේෂණ සහ ජනපද පිහිටුවීමට දායක වූයේ කෙසේ ද?

## හේතු සහ ප්‍රතිවිපාක විශ්ලේෂණය සඳහා යොමු කරන, ප්‍රශ්න රටාවලට උදාහරණ:

- ඔබ මෙම හේතුව/ප්‍රතිවිපාකය වර්ගීකරණය කරන්නේ කෙසේද? වර්ගීකරණයට හේතුව කුමක්ද? (සටහන: කෙටි කාලීන, දිගු කාලීන, අපේක්ෂිත, අනපේක්ෂිත, සෘජු, වක්‍ර වැනි විවිධ වර්ගීකරණයන් සිසුන්ට ලබා දීම.)
- .......... සහ .......... අතර ඇති සමානකම් සහ වෙනස්කම් මොනවාද?
- ..........ට තුඩු දුන්නේ / දායක වූයේ / හේතු වූයේ / බලපෑවේ කුමක්ද?
- .......... සහ .......... අතර සම්බන්ධය කුමක්ද?
- .......... බව මෙම මූලාශ්‍රයෙන් අදහස් කළ හැක්කේ ඇයි?
- .............. යැයි මෙම මූලාශ්‍රය හරහා යෝජනා කළ හැක්කේ ඇයි?
- ............ පිළිබඳ මෙම විවිධ මූලාශ්‍රවලින් අපට ගත හැකි නිගමන මොනවාද?

# 2ඇ. ඇගයීම සඳහා යොමු කරන ප්‍රශ්න

'ඇගයීම' කෙරෙහි අවධානය යොමු කරන ප්‍රශ්න, හේතු සහ ප්‍රතිවිපාක පිළිබඳව තක්සේරු කිරීමට සහ විනිශ්චය කිරීමට සිසුන්ට මග පෙන්වයි. නිදසුනක් වශයෙන්, අතීතයේ සිදු කරන ලද ක්‍රියාවන්හි අපේක්ෂිත අරමුණු අනුව ප්‍රතිවිපාක සාර්ථක හෝ අසාර්ථක ලෙස සැලකිය හැකිය. එසේම විවිධ කණ්ඩායම් සහ පුද්ගලයින් සඳහා ප්‍රතිවිපාක ධනාත්මක හෝ ඍණාත්මක වූ ප්‍රමාණය යනාදිය මත සිසුන්ට හේතු හෝ ප්‍රතිවිපාකවල සුවිශේෂතාව ඇගයීමට ලක් කළ හැකිය.

මෙම ප්‍රශ්න සිසුන්ට ඉතිහාසය පිළිබඳ තර්කන කුසලතා ගොඩනගා ගැනීමට අත්‍යවශ්‍ය වේ. ඇගයීම් ප්‍රශ්නවලට ප්‍රතිචාර දක්වන සිසුන් ඔවුන්ගේ විනිශ්චයන් සඳහා නිශ්චිත දැනුම, වලංගු සාක්ෂි සහ පැහැදිලි සාධාරණීකරණය සහ තර්ක භාවිත කිරීම වැදගත් වේ. ඇගයීම් ප්‍රශ්න විනිශ්චයන් සිදු කිරීම සම්බන්ධයෙන් වන බැවින්, මෙම ප්‍රශ්නවල බොහෝ විට 'වැඩිම', 'අවම', 'කොතරම් සාර්ථක ද', 'කොතරම් වැදගත් ද', සහ 'කොතරම් දුරට' වැනි වචන සහ වාක්‍ය ඛණ්ඩ අඩංගු වන බව ඔබට පෙනෙනු ඇත. මෙම වචන සහ වාක්‍ය ඛණ්ඩ නිරපේක්ෂ දෘෂ්ටිකෝණයකින් ප්‍රශ්නවලට පිළිතුරු දීමෙන් වැළකී සිටීමට සිසුන් යොමු කරයි. ඒ වෙනුවට, ඔවුන් වැදගත්කමේ මට්ටම, සාර්ථකත්වයේ මට්ටම යනාදි සාපේක්ෂ දෘෂ්ටිකෝණයන් වෙත නැඹුරු කරවයි. නිදසුනක් වශයෙන්, ප්‍රතිවිපාක මගින් නායකයෙකුගේ ප්‍රතිපත්තිය පරම සාර්ථකත්වයක් හෝ අසාර්ථකත්වයක් බව සරලව ප්‍රකාශ කරනවාට වඩා, 'කොතරම් දුරට' යන ප්‍රශ්නයකට ප්‍රතිචාර දක්වන සිසුන්, සංකීර්ණත්වය එක් කිරීමට සහ සමහර සීමාවන් පිළිගනිමින් ප්‍රතිපත්තිය බොහෝ දුරට සාර්ථක හෝ බොහෝ දුරට අසාර්ථක බව තක්සේරු කිරීමට වැඩි ඉඩක් ඇත.

### හේතුව සහ ප්‍රතිවිපාක ඇගයීම සඳහා යොමු කරන ප්‍රශ්නවලට උදාහරණ:

- සෝල්බරි ව්‍යවස්ථාවෙන් සිදු වූ වැදගත්ම ප්‍රතිවිපාක මොනවාද?
- දේශපාලන බලය කේන්ද්‍රගත කිරීමේ කාර්යයේ දී දුටුගැමුණු රජතුමා කොතරම් දුරට සාර්ථක වූයේ ද?
- ඉතාලියේ පුනරුදය ඇතිවීමට තුඩු දුන් වැදගත්ම කරුණු මොනවාද?
- 1960 - 65 කාලය තුළ බණ්ඩාරනායක ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලින් වැඩිපුරම බලපෑමට ලක්වූ කණ්ඩායම් මොනවාද? මෙම ප්‍රතිපත්තිවලින් අඩුවෙන්ම බලපෑමට ලක්වූ කණ්ඩායම් මොනවාද?
- කෝට්ටේ සහ යාපනයේ අතර ඇති වූ අභ්‍යන්තර ගැටුම් පෘතුගීසීන් හට මෙම රාජධානි අත්පත් කර ගැනීමට කෙතරම් වැදගත් වී ද?

**හේතුව සහ ප්‍රතිවිපාක ඇගයීම සඳහා යොමු කරන ප්‍රශ්න රටාවලට උදාහරණ:**

- .............. සිදු වීමට .......... කොතරම් දුරට ප්‍රධාන හේතුව වූයේ ද?
- ............ ට .......... හි බලපෑම කෙතරම් වැදගත් වූයේ ද?
- .......... කොතරම් සාර්ථක වූයේ ද?
- .......... ට වඩාත්ම වැදගත් හේතු මොනවාද...?
- ......... කොතරම් දුරට ........... සඳහා ධනාත්මක බලපෑමක් ඇති කළේ ද ...?

## 2ඈ. දෘෂ්ටිකෝණයන් ගවේෂණය කිරීමට ප්‍රශ්න

ඓතිහාසික චින්තනයේ ප්‍රධාන ලක්ෂණයක් වන්නේ විවිධ දෘෂ්ටිකෝණයන් ගවේෂණය කිරීම වන අතර එබැවින් අපගේ ඉගැන්වීම් තුළ මේ සඳහා යොමු කරන ප්‍රශ්න ඇතුළත් කිරීම අත්‍යවශ්‍ය වේ. අධ්‍යයනය කරන අතීතයේ සිදුවීම්, පුද්ගලයන් හෝ කාල පරිච්ඡේද පිළිබඳ විවිධ දෘෂ්ටිකෝණයන් සලකා බැලීමට සිසුන්ට ආරාධනා කළ හැකිය. කෙසේ වෙතත්, ඔවුන්ට මෙම මාතෘකා පිළිබඳ විවිධ සහ ක්‍රමයෙන් විකාශනය වන දෘෂ්ටිකෝණ ඔස්සේ, කාලයත් සමඟ වර්තමානය දක්වා ගවේෂණය කළ හැකිය.

හේතු සහ ප්‍රතිවිපාක පිළිබඳ දෘෂ්ටිකෝණය හා සම්බන්ධ ප්‍රශ්න සිසුන්ට මෙම විවිධ දෘෂ්ටිකෝණ හඳුනා ගැනීමට පමණක් නොව ඒවාට හේතු සලකා බැලීමට ද සහාය විය යුතුය. මෙයට ඔවුන්ගේ දැක්ම හැඩගස්වන පුද්ගලයෙකුගේ හෝ කණ්ඩායමක අනන්‍යතාවයේ විවිධ පැතිකඩ එනම්, වටිනාකම් පද්ධතිය, සමාජ ආර්ථික තත්ත්වය, ස්ත්‍රී පුරුෂ භාවය, ආගම, ජනවාර්ගිකත්වය, දේශපාලන නැඹුරුව, ජීවන අත්දැකීම් යනාදිය ඇතුළත් විය හැකිය. පැහැදිලිව හෝ ව්‍යංගව දෘෂ්ටිකෝණ ප්‍රකාශ කරන මූලාශ්‍ර විශ්ලේෂණය කිරීමේ දී දෘෂ්ටිකෝණය පිළිබඳ ප්‍රශ්න ඇතුළත් කිරීම ද විශේෂයෙන් වැදගත් වේ.

**හේතුව සහ ප්‍රතිවිපාක සම්බන්ධ දෘෂ්ටිකෝණය ගවේෂණය කිරීම සඳහා වූ ප්‍රශ්නවලට උදාහරණ:**

- 1947 දී ඉන්දියාව සාර්ථක ලෙස නිදහස ලබා ගැනීමට හේතු වූ වැදගත්ම හේතුව සම්බන්ධයෙන් මෙම ඉතිහාසඥයින් දෙදෙනා එකඟ නොවන්නේ ඇයි?
- ඔගස්ටස් සීසර් සිය පාලන කාලය තුළ යහපත් ප්‍රතිවිපාක ඇති කළ ශ්‍රේෂ්ඨ නායකයෙකු ලෙස සලකන්නේ සමාජයේ කුමන සාමාජිකයන් ද? එම මතයට එකඟ නොවන්නට සමාජයේ කුමන සාමාජිකයන් ද? එයට හේතුව කුමක් ද?

● නැගිටී සිටීමට හේතු පිළිබඳව මෙම මූලාශ්‍රයේ කතුවරයාගේ දෘෂ්ටිකෝණය කුමක්ද? මෙම කතුවරයා මෙම හේතු කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කළේ ඇයි?

● මෙම මූලාශ්‍රය/පෙළ නියෝජනය කරන්නේ කාගේ දෘෂ්ටිකෝණය ද? කාගේ දෘෂ්ටිකෝණය නියෝජනය නොකරන්නේ ද?

● කාලයත් සමඟ බ්‍රිතාන්‍ය යටත්විජිතවාදයේ ප්‍රතිවිපාක පිළිබඳ අදහස් වෙනස් වී ඇත්තේ කෙසේද?

## හේතුව සහ ප්‍රතිවිපාක සම්බන්ධ දෘෂ්ටිකෝණය ගවේෂණය කිරීම සඳහා වූ ප්‍රශ්න රටාවලට උදාහරණ:

● ............. පිළිබඳ මෙම මූලාශ්‍රයේ කතුවරයාගේ දෘෂ්ටිකෝණය කුමක්ද? ඔබට ප්‍රකාශ කළ හැක්කේ කෙසේ ද? ඔවුන් මෙම මතය දරන්නේ ඇයි?

● මේ නායකයාට .......... අවශ්‍ය වන්නට ඇත්තේ ඇයි?

● සමාජයේ කුමන සාමාජිකයන් මෙය ............. ලෙස දකින්නට ඇතිද?

● කාලයත් සමඟ ............. පිළිබඳ අදහස් වෙනස් වී ඇත්තේ කෙසේද? කාලයත් සමඟ ........... පිළිබඳ අදහස් වෙනස් වී ඇත්තේ ඇයි?

● ඉතිහාසඥයන් .............. සමඟ එකඟ නොවන්නේ ඇයි?

● ............. හි ප්‍රකාශ නොකෙරෙන්නේ කාගේ දෘෂ්ටිකෝණය ද?

# 3.

# පාඩම් සඳහා ප්‍රශ්න ඒකාබද්ධ කිරීමේ උපාය මාර්ග



# 3ඇ. ආරම්භක ක්‍රියාකාරකම්

ආරම්භක ක්‍රියාකාරකමක් යනු සිසුන්ට පන්ති කාමරයට ගිය විගස සම්පූර්ණ කළ හැකි සරල සහ ඉක්මන් වැඩක් ය. ආරම්භක ක්‍රියාකාරකම් හරහා පාඩමට අවශ්‍ය පසුබිම සකසයි. සියලුම සිසුන් එම වැඩෙහි නිරත වන බව සහ ඒ පිළිබඳව සිතන බව සහතික කිරීම සඳහා, මෙම ආරම්භක ක්‍රියාකාරකම්වලට ඔවුන් යොමු කිරීම වැදගත් වන අතර, අදාළ වැඩෙහි දී සපයා ඇති නිශ්චිත තොරතුරුවලින් පමණක් පිළිතුරු ලබා දිය යුතුය.

## හේතුව සහ ප්‍රතිවිපාක පිළිබඳ ප්‍රශ්න ඒකාබද්ධ කිරීමට හැකි ආරම්භක ක්‍රියාකාරකම් සඳහා උදාහරණ:

- පින්තූර මූලාශ්‍රයක් පෙන්වා, ප්‍රශ්න එකක් හෝ කිහිපයක් ඇසුරෙන් එය විශ්ලේෂණය කරවීම
- ප්‍රශ්න එකකට හෝ වැඩි ගණනකට පිළිතුරු ලිවීමට දීම.
- ප්‍රශ්න එකක් හෝ කිහිපයක් ගැන සිතන්න, හවුල්කරුවෙකු සමඟ යුගල කරන්න, සාකච්ඡා කරන්න, සහ අදහස් බෙදා ගන්න යොමු කිරීම
- සිද්ධියක් මත පදනම් වූ ප්‍රශ්න එකක් හෝ කිහිපයක් තේරීම සහ භූමිකාව රඟ දැක්වීම

# 3ආ. Plenary

Plenary යනු සිසුන් පාඩමෙන් ඉගෙන ගත් දේ ඇගයීමට ලක් කරන කාර්යයකි. සිසුන්ට ඔවුන්ගේ ඉගෙනීම ගැන මෙනෙහි කිරීමට අවස්ථාවක් ලබා දීම සහ පාඩමේ ඉලක්ක සහ අරමුණු සම්බන්ධයෙන් ගුරුවරයාට ප්‍රතිපෝෂණ ලබා දීම මෙහි අරමුණයි. හොඳ Plenary පාඩමේ අරමුණු සමඟ සෘජුව සම්බන්ධ වන අතර ඉතා මැනවින් සිසුන් ක්‍රියාශීලීව සිතීමට සහ එකට සහයෝගයෙන් කටයුතු කිරීමට සහය වෙයි. පාඩමක් අතරතුර හෝ පසුව Plenary පැවැත්විය හැකිය. විවිධ ආබාධ සහිත සිසුන් සඳහා ඔවුන්ට ගැළපෙන සේ වෙනස් Plenary හඳුන්වා දිය යුතුය.

## හේතුව සහ ප්‍රතිවිපාක පිළිබඳ ප්‍රශ්න ඒකාබද්ධ කිරීමට හැකි plenary සඳහා උදාහරණ:

- KWL : මෙයට සිසුන් ඔවුන් දැනටමත් දන්නා දේ, අනාගතයේ දී ඔවුන්ට ඉගෙන ගැනීමට අවශ්‍ය දේ සහ පාඩමේ දී ඔවුන් ඉගෙන ගත් දේ සම්බන්ධ පැහැදිලි කිරීම් ඇතුළත් වේ.
- ජෙපර්ඩි - Jeopardy : ඉගෙන ගත් මාතෘකා පිළිබඳව ජෙපර්ඩි ක්‍රීඩාවක් සෑදීම සහ සිසුන් ඉඟිවලට ප්‍රතිචාර දක්වමින්, ප්‍රශ්න ආකෘතීන්ට පිළිතුරු සපයයි; මෙය සිසුන්ට හේතුව සහ ප්‍රතිවිපාක පිළිබඳ ප්‍රශ්න

තමන් විසින්ම සකස් කර ගැනීමට පුරුදු කරවීම සඳහා ඉතා හොඳ ක්‍රමයකි.

● මූල පදය - Keyword : සිසුන්ට හේතුවක් හෝ ප්‍රතිවිපාකයක් පිළිබඳ ඉඟි කරන මූලික පදයක් ලබා දෙන අතර සිසුන් එය කුමන ඓතිහාසික සිදුවීමකට සම්බන්ධ ද යන්න පිළිබඳ ප්‍රශ්නයකට පිළිතුරු දිය යුතුය.

● ටොපික් ටෙනිස් - Topic tennis : ක්‍රීඩා කරන්නන් දෙදෙනෙකු සහ එක් විනිසුරුවරයෙකු ලෙස සිසුන් තුන් දෙනෙකුගෙන් යුතු කණ්ඩායම් සාදන්න; මෙහිදී ''ගැටුමට කෙටිකාලීන හේතු මොනවාද?" වැනි ප්‍රශ්නයක් විනිසුරු අසයි. එසේම ක්‍රීඩකයින් ඔවුන්ගේ අදහස් අවසන් වන තුරු හේතු හඳුනා ගෙන ඉදිරිපත් කරයි. ; ජයග්‍රහණය කරන්නේ කවුරුන් දැයි විනිසුරු විසින් තීරණය කරයි.

● පිටවීමේ ප්‍රවේශ පත්‍රය - Exit ticket : සිසුන්ට හඳුනාගත් ඓතිහාසික සිදුවීමක් සහිත පත්‍රිකාවක් ලබා දිය හැකි අතර සිසුන්ට පන්ති කාමරයෙන් පිටව යාමට නම් එම ඓතිහාසික සිදුවීම හා සම්බන්ධ හේතුවක් හෝ ප්‍රතිවිපාකයක් පිළිබඳ ප්‍රශ්නයකට පිළිතුරු දිය යුතුය.

# 3ඈ. සාකච්ඡා

හේතුව සහ ප්‍රතිවිපාක සම්බන්ධ ප්‍රශ්න ඒකාබද්ධ කිරීම වෙනුවෙන් කළ හැකි සාකච්ඡා විවිධ ආකාර වේ. ප්‍රධාන සාකච්ඡා වර්ග දෙකක් ලෙස කුඩා කණ්ඩායම් සාකච්ඡා සහ මුළු පන්තියම එක්ව සිදු කරන සාකච්ඡා දැක්විය හැකිය. මෙහිදී හේතු සහ ප්‍රතිවිපාක අතර සබඳතා කෙරෙහි සිසුන් සම්බන්ධ කර ගැනීම පිළිබඳ අවධානය යොමු කරන, හොඳින් සිතා බලා සැකසූ ප්‍රශ්න සමඟ සාකච්ඡා මෙහෙයවිය යුතුය. අවශ්‍ය පරිදි, සිසුන් සාකච්ඡා ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙන විට ඔවුන්ගේ තර්ක සහ සාක්ෂි පැහැදිලිව ඉදිරිපත් කරන බව සහතික කිරීම සඳහා ගුරුවරුන් පසු විපරම් ප්‍රශ්න ඇසිය යුතුය (උදාහරණයක් ලෙස ''ඒ අදහස සනාථ කරන්න ඔබ භාවිත කරන්නේ කුමන සාක්ෂි ද?'' වැනි ගැටලු).

## හේතු වටා කේන්ද්‍ර වූ සාකච්ඡා ප්‍රශ්න සඳහා උදාහරණ:

● හේතුව පැහැදිලිවම ඓතිහාසික සිදුවීම හා සම්බන්ධ ද එසේත් නැති නම් අහම්බයක් පමණක් නොවේ ද? එසේ නම් ඇයි? නොඑසේ නම් ඇයි?

● කිසියම් සුවිශේෂී සාධකයක් ඉවත් කළහොත්, එම ඓතිහාසික සිදුවීම තව දුරටත් එසේම පවතී ද? එසේ නම් ඇයි? නොඑසේ නම් ඇයි?

● ඓතිහාසික සිදුවීමේ තීව්‍රතාවය සඳහා හේතුව කොතරම් දුරට දායක වූයේද?

● යම් සුවිශේෂී හේතුවක් නිසා වෙනත් හේතූන් කොතරම් දුරට අඩු හෝ වැඩි වී තිබේද?

▪ ඓතිහාසික සිදුවීම සිදු වූයේ ඇයි ද යන්න පිළිබඳව, මෙතෙක් සලකා බලා නොමැති විකල්ප පැහැදිලි කිරීම් තිබේද? තිබේ නම්, ඒවා මොනවාද? එසේ නොවේ නම්, එසේ නොවිය හැක්කේ කුමක් නිසාද?

**ප්‍රතිවිපාක වටා කේන්ද්‍ර වූ සාකච්ඡා ප්‍රශ්න සඳහා උදාහරණ:**

- ඓතිහාසික සිදුවීමේ ප්‍රතිවිපාක කෙතරම් බලවත් වූයේ ද? අපි එය දන්නේ කෙසේ ද?
- ඓතිහාසික සිදුවීමේ ප්‍රතිවිපාක විවිධ සමාජ පන්තිවලට බලපෑවේ කෙසේද? ධනාත්මකව බලපෑවේ කුමන කණ්ඩායම්වලට ද? ඍණාත්මක ලෙස බලපෑවේ කුමන කණ්ඩායම්වලට ද? එම බලපෑම් සිදු වූයේ ඇයි හෝ කෙසේද?
- ඓතිහාසික සිදුවීමේ ප්‍රතිවිපාක කෙතරම් පුළුල් ද? එම ඓතිහාසික සිදුවීමට ඍජුව සම්බන්ධ නොවූ වෙනත් ස්ථානවලට හෝ රටවලට බලපෑම් එල්ල වූයේද? එසේ නම්, ඒ කොහේද?
- ඓතිහාසික සිදුවීමේ ප්‍රතිවිපාක කොපමණ කාලයක් පැවතුණි ද?

# 3ඈ. ලිඛිත අභ්‍යාස

ලිඛිත අභ්‍යාස ඇසුරෙන් හේතු සහ ප්‍රතිවිපාක ප්‍රශ්න ඒකාබද්ධ කිරීම සඳහා ක්‍රියාකාරකම් රාශියක් ඇතුළත් කළ හැකිය. ලිඛිත අභ්‍යාස සඳහා තනි ප්‍රශ්නයක් (උදා: ක්ෂණික රචනයක්) හෝ විවේචනාත්මක චින්තනය ප්‍රවර්ධනය කරන අන්තර් සම්බන්ධිත ප්‍රශ්න මාලාවක් (උදා: වැඩ පත්‍රිකාවක්) ඇතුළත් විය හැකිය.

කිසියම් ප්‍රතිඵලයක් ලබා ගැනීම සඳහා සිසුන්ට මඟ පෙන්වන ලිඛිත අභ්‍යාස මාලාවක් ඇතුළත් කිරීම පිළිබඳ ගුරුවරුන්ට සලකා බැලිය හැකිය. නිදසුනක් වශයෙන්, යම් ඓතිහාසික සිදුවීමක් සඳහා හේතු අධ්‍යයනය කරන ඒකකයක, මුලින්ම කෙටි කාලීන හේතු හඳුනා ගැනීම සඳහා වන ප්‍රශ්නවලින් ආරම්භ කර, පසුව මධ්‍ය කාලීන හේතූන් වෙත අවධානය යොමු කර, අවසානයේ දී දිගු කාලීන හේතු හඳුනා ගැනීමේ ප්‍රශ්නවලින් අවසන් වන පරිදි ගුරුවරුන්ට ප්‍රශ්න නිර්මාණය කළ හැකිය. හේතු සමූහයක් හඳුනා ගැනීමෙන් පසුව ඊළඟ ප්‍රශ්න මාලාව වෙත යොමු වීම - 'අගුළු හැරීම - මබකදජනි' සිදු කරයි, එබැවින් සිසුන්ට සියලුම ප්‍රශ්න එකවර නොපෙනේ. සෑම ප්‍රශ්න මාලාවක් තුළම, ලිඛිත අභ්‍යාසට උත්සාහ කිරීමට පෙර සමහර මූලාශ්‍ර කියවීමට සහ අනෙක් අය සමඟ සාකච්ඡා කිරීමට සිසුන් උනන්දු කළ හැකිය.

මෙම ලිඛිත අභ්‍යාස, ඉහත 3ජ සාකච්ඡාවේ විස්තර කර ඇති ප්‍රශ්නවලට සමාන ප්‍රශ්න මත පදනම් විය හැක. වැඩ පත්‍රිකා හෝ වෙනත් බහුවරණ ක්‍රියාකාරකම් නිර්මාණය කිරීමේ දී, ගුරුවරුන් මුලින්ම හේතු හෝ ප්‍රතිවිපාක විශ්ලේෂණය කිරීමට සහ ඇගයීමට සිසුන්ට අවශ්‍ය වන වඩාත් සංකීර්ණ ප්‍රශ්න වෙත යාමට පෙර සිසුන් ප්‍රධාන තොරතුරු හඳුනාගෙන ඒවා තේරුම් ගෙන තිබේද යන්න පරීක්ෂා කිරීමට අදාළ ප්‍රශ්නවලින් පටන් ගැනීම වඩා යෝග්‍ය වේ.

# 3ඉ. ආකෘතික ඇගයීම් සහ සාරාංශ ඇගයීම්

ආකෘතික ඇගයීම් මගින් ඉගෙනුම් ක්‍රියාවලියේ දී සිසුන්ගේ ඉගෙනීම පිළිබඳ ප්‍රතිපෝෂණ ගුරුවරුන් හට සපයා දෙයි. ආකෘතික ඇගයීම් සාමාන්‍යයෙන් අඩු කොටස්වලින් යුක්ත වන අතර විධිමත් ලිඛිත ශ්‍රේණියක් හෝ ලකුණක් නොදරයි. ආකෘතික ඇගයීම්වලට පන්ති කාමරයේ සිදු කරන සාකච්ඡා, කෙටි ලිඛිත වැඩ, ගෙදර වැඩ පැවරුම්, කෙටි ප්‍රශ්නාවලි හෝ සමීක්ෂණ ඇතුළත් විය හැක. සාරාංශ ඇගයීම් යනු විභාග ලකුණු ක්‍රමයක් හෝ වෙනත් විධිමත් ප්‍රමිතියක් හෝ මිණුම් ලකුණක් යටතේ ශ්‍රේණිගත කරන ලද විධිමත් ඇගයීම් (විභාග, ව්‍යාපෘති හෝ පරීක්ෂණ) වේ. සාරාංශ ඇගයීම්වලට වාර පරීක්ෂණ, අවසාන විභාග, ප්‍රමිතිගත පරීක්ෂණ, හෝ අවසාන ව්‍යාපෘති හෝ ඉදිරිපත් කිරීම් ඇතුළත් විය හැක. ඇගයීම් වර්ග දෙකෙන්ම සිසුන්ගේ ඉහළ කාර්ය සාධනය සඳහා පැහැදිලි නිර්ණායක, ශිෂ්‍ය ස්වයං ආවර්ජනය වැඩිදියුණු කිරීමට සහ සිසුන්ගේ වැඩි දියුණුව සඳහා ප්‍රතිපෝෂණ සහ අවස්ථා ලබා දීම සිදු කළ යුතුය.

## හේතුව සහ ප්‍රතිවිපාක පිළිබඳ සංකල්ප ඒකාබද්ධ කිරීම සඳහා වූ ප්‍රශ්නවලට උදාහරණ:

- බහුවරණ ප්‍රශ්න: මෙම ප්‍රශ්න සිසුන්ගේ ඉගෙනීම කෙසේද යන්න පරීක්ෂා කිරීමට උපකාර වන පරිදි විවිධ ආකාරවලින් සැකසිය හැකිය. උදාහරණ වශයෙන්:
    - ............ හැර පහත දැක්වෙන සියල්ල හේතු වේ
    - ............. සඳහා උත්ප්‍රේරකයක් වූයේ පහත සඳහන් කුමන හේතු ද?
    - පහත සඳහන් දේවලින් ........... හි ප්‍රතිවිපාකයක් නොවන්නේ මොනවාද?
    - ............ හැර පහත සඳහන් සියල්ල දිගුකාලීන ප්‍රතිවිපාක විය:

- කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න: මෙම ප්‍රශ්න ඇසුරෙන් සිසුන්ට හේතු සහ ප්‍රතිවිපාක හඳුනා ගැනීමට සහ ඔවුන් සිතන ආකාරය පැහැදිලි කිරීමට අවස්ථාවක් ලබා දෙනු ඇත. කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න බොහෝ ආකාරවලින් තිබිය හැකිය. ඒවා අවබෝධය පරීක්ෂා කරන, විශ්ලේෂණයට යොමු කරන කරන හෝ කෙටි ඇගයීමක් අවශ්‍ය කරන ප්‍රශ්න විය හැකිය. (ප්‍රශ්න සඳහා උදාහරණ අවශ්‍ය නම් 2 කොටස බලන්න). කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න සඳහා සිසුන්ට යම් උපුටා ගත් පාඨයකට ප්‍රතිචාර දැක්වීමට සිදු විය හැකිය. (උදා: ප්‍රාථමික මූලාශ්‍රයක් හෝ ඉතිහාසඥයෙකුගේ අදහසක උපුටා දැක්වීමක්) එසේ නැතිනම් සිසුන්ට ඔවුන්ගේම දැනුමෙන් පිළිතුරු සැපයීමට සිදු විය හැකිය. උදාහරණ වශයෙන්:
    - මධ්‍ය ශිලා යුගයේ දඩයම්කරුවන් ශ්‍රී ලංකාව අත්පත් කර ගෙන සිටි බවට ඇති අදහස සනාථ කරන සාක්ෂි මොනවාද?
    - ශ්‍රී ලංකාවේ සිදු වූ ලන්දේසි ජනපදකරණයේ කෙටි කාලීන ප්‍රතිවිපාක මොනවාද?
    - බ්‍රිතාන්‍යය සිය යටත් විජිත සමයේ සාමාන්‍ය ශ්‍රී ලාංකිකයන්ගේ ජන ජීවිත පාලනය කළේ කෙසේද?

● රචනා ප්‍රශ්න: මෙම ප්‍රශ්න ඇසුරෙන් සිසුන්ට හේතු සහ ප්‍රතිවිපාක පිළිබඳ ගැඹුරින් විශ්ලේෂණය කිරීමට සහ ඇගයීමට ලක් කිරීමට අවස්ථාව සලසයි. රචනා ප්‍රශ්නවලින් හුදෙක් සිසුන්ට ඓතිහාසික සිද්ධීන් විස්තර කිරීම පමණක් අපේක්ෂා නොකළ යුතුය. හොඳ රචනා ප්‍රශ්නයක් හරහා, තර්කවල (ලකුණු සහ ප්‍රතිලකුණු) විවිධ පැති එකකට එකක් සමව සලකා බැලීමට සිසුන් යොමු කළ යුතු වේ. උදාහරණ ලෙස:

- රාජාණ්ඩු පාලනය ශ්‍රී ලංකාවේ සමාජ සබඳතාවලට කොතරම් දුරට බලපෑම් ඇති කළේ ද?
- යටත් විජිතකරණය ශ්‍රී ලංකාවේ සමාජ සම්බන්ධතාවලට කොතරම් දුරට බලපෑම් ඇති කළේ ද?

# 3ඊ. වෙනස් කිරීම්

වෙනස් කිරීම් යනු එක් එක් ශිෂ්‍ය අවශ්‍යතා සපුරාලීමට අනුවර්තනය වීමේ පුහුණුවයි. වෙනස් කිරීම් මඟින් සිසුන්ට ඉගෙන ගන්නා ආකාරය මෙන්ම එම ඉගෙනීම ප්‍රදර්ශනය කරන්නේ කෙසේද යන්න පිළිබඳ තීරණ ලබා දේ. ගුරුවරුන්ට යම් පන්තියක අන්තර්ගතය, උපදෙස්, ක්‍රියාවලිය හෝ ඉගෙනුම් පරිසරය වෙනස් කළ හැක. වෙනස් කිරීම් භාවිත කරමින් හේතු සහ ප්‍රතිවිපාක ප්‍රශ්න ඒකාබද්ධ කිරීමේ දී, ගුරුවරුන් එක් එක් ශිෂ්‍ය අවශ්‍යතා සහ හැකියාවන් මතක තබා ගත යුතුය.

## හේතු සහ ප්‍රතිවිපාක පිළිබඳ ප්‍රශ්න ඒකාබද්ධ කිරීමට හැකි, වෙනස් කිරීමේ උපාය මාර්ග සඳහා උදාහරණ:

● සිසුන් මුහුණ දුන් පුද්ගලික සිදුවීමකින් ආරම්භ කිරීම: ඔවුන් මෑතක දී පැවති විභාගයකට හෝ ක්‍රීඩා ඉසව්වකට මුහුණ දුන්නේ කෙසේ ද යන්නට හේතු (ඔවුන් කොතෙක් වෙහෙස මහන්සි වී පාඩම් කළත් හෝ පුහුණුවීම් කළත්, මානසික යහපැවැත්ම අනුව එදින ඔවුන්ට හැඟුණේ, දැනුණේ කෙසේද) සහ එමඟින් ලැබුණු ප්‍රතිවිපාක (ඔවුන් තත්ත්වය ඉදිරියට යාම සඳහා ඉගෙනීම හෝ පුහුණු වීම වෙනස් ලෙස සිදු කරගෙන යන ආකාරය, ඔවුන් ඉගෙන ගැනීමට උත්සාහ කරන නව කුසලතා මොනවාද) ඇගයීම

● ගැලීම් ප්‍රස්ථාර හෝ මනෝ සිතියම් (mind maps) හෝ තොරතුරු වෙබ් (information webs) භාවිත කිරීම: විවිධ වර්ගයේ හේතු සහ ප්‍රතිවිපාක අතර වෙනස හඳුනා ගැනීම සඳහා වර්ණ පෙළක් භාවිත කරමින් ශිෂ්‍යයින් ලවා ඉහත ඒවා නිර්මාණය කිරීමට සලස්වන්න; ඒවා මගින් සිසුන්ට ඊතල, මූල පද (keywords) සහ පින්තූර භාවිතයෙන් හේතු සහ ප්‍රතිවිපාක දැක්වීමට උපකාරී වේ.

● මිශ්‍ර හැකියාවන් සහිත සිසුන් කණ්ඩායම් ගත කිරීම: සාකච්ඡා හෝ ලිඛිත වැඩ අතරතුර විවිධ හැකියාවන් ඇති සිසුන් කණ්ඩායම් කළ හැකි අතර එමඟින් ඔවුන්ට අදහස් සහ තොරතුරු බෙදා ගත හැකිය.

● අනිවාර්යයෙන් කළ යුතු, කළ යුතු සහ හැකි නම් කළ යුතු ප්‍රශ්න: සිසුන්ට ගෙදර වැඩ ලෙස හෝ පන්ති කාමරයේ දී පිළිතුරු සැපයීම සඳහා ප්‍රශ්න ලබා දෙන විට, සියලුම සිසුන් විසින් අනිවාර්යයෙන්ම සම්පූර්ණ කළ යුතු අත්‍යවශ්‍ය ප්‍රශ්න ලෙස ඇතැම් ප්‍රශ්න පැවරීමට ගුරුවරුන්ට හැකිය. එසේම බොහෝ සිසුන් විසින් සම්පූර්ණ කළ යුතු අමතර ප්‍රශ්න ඔවුන්ට සැපයිය හැකි අතර, අවසාන වශයෙන්, තමන්ගේ දැනුම වඩා වැඩියෙන් දියුණු කර ගැනීමට කැමති සිසුන්ට හැකි නම් සම්පූර්ණ කළ හැකි වඩාත් සංකීර්ණ සහ සීමාවෙන් එපිට ප්‍රශ්න සැපයිය හැකිය.

● ශිෂ්‍ය විකල්ප ක්‍රම තේරීම: ප්‍රශ්නයකට නිශ්චිත ආකාරයේ ප්‍රතිචාරයක් අනිවාර්යයෙන් අවශ්‍ය නොවේ. ගුරුවරුන් සිසුන්ට 'විශාල' ප්‍රශ්නයක් (උදා: ".......... සඳහා වැදගත්ම හේතුව වූයේ කුමක්ද...?") සැකසිය හැකි අතර සිසුන්ට ඔවුන්ගේ පිළිතුර ඉදිරිපත් කරන්නේ කෙසේද යන්න පිළිබඳ විකල්ප ක්‍රම ලබා දිය හැකිය: එම විකල්ප, කෙටි රචනයක්, රූප සටහනක් හෝ දෘශ්‍ය නිරූපණයක්, වාචික ඉදිරිපත් කිරීමක් හෝ කෙටි වීඩියෝවක්, පෝස්ටරයක් යනාදිය විය හැකිය. ඔවුන් පිළිතුරු සැපයීමට තෝරා ගන්නා ක්‍රමය කුමක් වුවත්, සියලුම සිසුන් විසින් ඉටු කළ යුතු අවශ්‍යතා පැහැදිලිව ඔවුන්ට සන්නිවේදන කිරීමට ගුරුවරුන් ප්‍රවේශම් විය යුතුය. (උදා. පිළිතුර පැහැදිලිවම විවිධ හේතූන් සංසන්දනය කළ යුතුය, සමස්ත පිළිතුරට සහාය වීමට හේතු සහ සාක්ෂි ලබා දිය යුතුය.). ආකෘතික ඇගයීම් කාර්යයක් ලෙස මෙය විශේෂයෙන් ප්‍රයෝජනවත් විය හැක.

# 4.

# සකස් කරන ලද උදාහරණ



ශ්‍රී ලංකාවේ පන්තිකාමර තුළට, හේතුව සහ ප්‍රතිවිපාක පිළිබඳ ප්‍රශ්න කිරීම් ඒකාබද්ධ කළ හැකි ආකාරය තවදුරටත් පැහැදිලි කිරීම සඳහා ඉතිහාස විෂය මාලාවට සම්බන්ධ ජාතික පෙළපොත්වල එන පරිච්ඡේද හතරකින් ආවරණය වන මාතෘකා දෙකකට අදාළ උදාහරණ අපි සකස් කර ඇත්තෙමු. පළමු මාතෘකාව වනුයේ පුනරුදය වන අතර එය 8 ශ්‍රේණියේ "යුරෝපයේ පුනරුදය" සහ 10 ශ්‍රේණියේ "පුනරුදය" යන පරිච්ඡේදයන් පිළිබඳව සාකච්ඡාවට ලක් කෙරේ. දෙවන මාතෘකාව යුරෝපීය ගවේෂණ සහ එහි ශ්‍රී ලංකාව සමඟ ඇති සම්බන්ධය වන අතර, එය 8 ශ්‍රේණියේ ''දේශ ගවේෂණ සහ යුරෝපා ජාතීන්ගේ පෙරදිගට පැමිණීම" මෙන්ම 10 ශ්‍රේණියේ "ශ්‍රී ලංකාව හා බටහිර ලෝකය" යන මාතෘකා හා සම්බන්ධ වේ. අපි සමාන අන්තර්ගතයන් සහිත ඒකක තෝරාගෙන ඇති නමුත්, විවිධ වයස් කාණ්ඩ සඳහා ප්‍රශ්න කිරීම සිදු කරන්නේ කෙසේද යන්න නිරූපණය කිරීමට විවිධ වයස් මට්ටම් ඉලක්ක කර ඇත.

සෑම මාතෘකාවක් සඳහාම අපි සිසුන් සමඟ පැහැදිලි කළ යුතු කෙටි දළ විශ්ලේෂණයක් සහ අදාළ පාරිභාෂිත වචන පිළිබඳ සංක්ෂිප්ත සටහනක් සපයා ඇත. ඉන් පසුව අපි 8 ශ්‍රේණියේ සහ 10 ශ්‍රේණියේ එක් එක් පරිච්ඡේදවලට අදාළව උදාහරණ ප්‍රශ්න සහ මාර්ගෝපදේශ සපයා දී ඇත.

බොහෝ ශ්‍රී ලාංකික ගුරුවරුන්ට වැඩ කිරීමට හැකියාව ඇත්තේ නිර්දේශිත පෙළපොත්වලින් පමණක් බව වටහා ගනිමින්, අපි එක් එක් උදාහරණය තුළ ඉහත දක්වා ඇති විවිධ වර්ගයේ ප්‍රශ්න මාලාවක් සපයා ඇත. පෙළපොත පමණක් කේන්ද්‍ර කරගත් පාඩම් වෙනුවට හේතුව සහ ප්‍රතිවිපාක පිළිබඳ තවදුරටත් විවේචනාත්මක චින්තනය එක් කිරීමට ඒවා භාවිත කළ හැකිය.

ගුරුවරුන් සඳහා අමතර තොරතුරු ලබා ගත හැකි තොරතුරු මූලාශ්‍ර පිහිටුවීමට සහ ප්‍රවේශ වීමට සහ/හෝ සිසුන්ට අමතර තොරතුරු ලබා ගත හැකි තොරතුරු මූලාශ්‍ර වෙත ප්‍රවේශ වීමට හැකියාව ඇත - සබැඳි වෙබ් අඩවි, ලේඛනාගාර ආදියෙන් - අපි අමතර උදාහරණ සහ යෝජනා එකතු කර ඇත.

# 4අ. මාතෘකාව අංක 1: පුනරුදය

## i. සග දළ විශ්ලේෂණය

යුරෝපීය පුනරුදය යනු 8 ශ්‍රේණිය සහ 10 ශ්‍රේණිය යන දෙකෙහිම පරිච්ඡේද තුළ අඩංගු මාතෘකාවකි. මෙම පෙළපොත්වල 'පුනරුදය' යන යෙදුම පුළුල් ලෙස '' යළි පිබිදීම" ලෙස අර්ථ දක්වා ඇති නමුත් 14 වන සහ 16 වන සියවස් අතර යුරෝපයේ සිදුවෙමින් පැවතුණ ''නාට්‍යාකාර පරිවර්තන" කාල පරිච්ඡේදයක් ලෙස ද හැඳින්වේ. පෙළපොත්වල අවධානය වැඩි වශයෙන් යොමු වී ඇත්තේ ඉතාලිය කෙරෙහි වන නමුත් ප්‍රංශය, ජර්මනිය සහ

එංගලන්තයේ දියුණුව ද ගවේෂණය කරයි. මෙම කාල පරිච්ඡේදයේ උදාහරණ ලෙස විශේෂයෙන්ම උතුරු යුරෝපයේ රටවල් ඇතුළු තවත් රටවල් කිහිපයක් ඇතුළත් කිරීමට හැකිය. පෙළපොත්වලට ඒවායේ අධ්‍යයන කාල සීමාව තුළ කලාව, ගෘහ නිර්මාණ ශිල්පය, විද්‍යාව, වෛද්‍ය විද්‍යාව සහ ආගම ඇතුළු පුළුල් පරාසයක ක්ෂේත්‍ර ඇතුළත් වේ. ප්‍රතිසංස්කරණය තර්කානුකූලව ගත් කළ පුනරුදය සමඟ සම්බන්ධයක් ඇති නමුත්, මෙම සංසිද්ධි දෙක සාමාන්‍යයෙන් වෙන වෙනම සලකනු ලැබේ.

පුනරුදය යන මාතෘකාව සම්බන්ධයෙන් පවතින ඇතැම් ප්‍රධාන ඉතිහාස විෂයක ප්‍රශ්න, වාද විවාද සහ තර්ක පිළිබඳව දැනුවත්ව සිටීම ගුරුවරුන් හට ප්‍රයෝජනවත් විය හැකිය. විශේෂයෙන්ම, බොහෝ විද්වතුන් ‘‘පුනරුදය” යන සමස්ත සංකල්පයම ප්‍රශ්න කිරීමට ලක් කරන අතර, ‘‘පුනරුදය” පැවති බව පවා අපට පැවසිය හැකිද යන්න ප්‍රශ්න කරයි. ඇතමුන් මෙය බොහෝ පසුකාලීන ඉතිහාසඥයින් විසින්, එකිනෙකින් ස්වාධීනව සලකා බැලිය හැකි ඉතා පුළුල් පරාසයක වෙනස් වීම් සහ වර්ධන තත්ත්වයන් හැඳින්වීම සඳහා ආරුඪ කරන ලද නමක් සහ අදහසක් ලෙස හඳුන්වයි.

[2]තවත් අය ඒ සමඟ එකඟ නොවන අතර ඔවුන් යෝජනා කරනුයේ බහුවිධ ‘පුනරුදයන්’ හෝ ‘ඉතාලි පුනරුදයක්’ වැනි හුදකලා පුනරුදයන් පිළිබඳ ඇති මෙම අදහස, යුරෝපයේ විවිධ ක්ෂේත්‍රවල සහ ඈත ප්‍රදේශවල මෙම පුනර්ජීවනයේ සහ පරිවර්තනයේ වෙනස් වීම් අතර පැවති ගැඹුරු සම්බන්ධතා නොසලකා හරින බවයි. [3]ඇතැම් ඉතිහාසඥයින් තර්ක කරන්නේ පුනරුදය යුරෝපීය සංසිද්ධියක් පමණක් නොවන බවත් යුරෝපීය නොවන ලෝකයේ අනෙකුත් පුනරුදයන් පිළිබඳ අදහස අප ගවේෂණය කළ යුතු බවත් ය. [4]යුරෝපයේ පුනරුද සමය නිශ්චිතවම කවදා ආරම්භ වී කවදා අවසන් වූවාද යන්න පිළිබඳව ඉතිහාසඥයින්ගේ එකඟතාවක් නොවන අතර, විවිධ මූලාශ්‍රවල, ඓතිහාසික කෘතිවල සහ පෙළපොත්වල ඒ පිළිබඳව විවිධ දිනයන් ඔබට දැක ගත හැකිය.

ඉතිහාසයේ තරඟකාරී ස්වභාවය සිසුන්ට හඳුන්වා දීම සඳහා එවැනි ඉතිහාස විෂයික විවාද පන්ති කාමරයට ගෙන ඒම රසවත් විය හැකිය. ඇත්ත වශයෙන්ම, අපි පුනරුදයේ හේතු සහ ප්‍රතිවිපාක විමර්ශනය කරන්නේ නම්, “පුනරුදය” යන ශීර්ෂපාඨය යටතේ, එය ආරම්භ වන විට සහ අවසන් වන විට ඇතුළත් කළ යුතු දේ සහ සලකා බැලීම අදාළ වේ.

[2] BULLEN, J. B., ‘The Foundations of Renaissance Historiography in the Eighteenth Century Voltaire and Gibbon’, The Myth of the Renaissance in Nineteenth-Century Writing (Oxford, 1994; online edn, Oxford Academic, 3 Oct. 2011), https://doi.org/10.1093/acprof:oso/9780198128885.003.0002, accessed 16 Sept. 2022.

[3]Lee, Alexander, ‘Introduction: A Wider Renaissance?”, Renaissance? Perceptions of Continuity and Discontinuity in Europe, c.1300-c.1550, edited by Alexander Lee, Pit Perporte, Harry Schnitker. Brill: Leiden, 2010, p.247.

[4]BLITSTEIN, P. (2021). A GLOBAL HISTORY OF THE ‘MULTIPLE RENAISSANCES’. The Historical Journal, 64(1), 162-184. doi:10.1017/S0018246X19000608

## ii. මූලික පාරිභාෂිත වචන

මානවවාදය: මිනිසාගේ ස්වභාවය වඩාත් හොඳින් අවබෝධ කර ගැනීම පිළිබඳව සහ ගුණවත් ජීවිතයක් ගත කරන්නේ කෙසේද යන්න කෙරෙහි අවධානය යොමු කරන බුද්ධිමය ව්‍යාපාරයකි. එය සාක්ෂාත් කර ගැනීමේ මාර්ග ලෙස, අධ්‍යාපනය, සාහිත්‍යය, කලාව සහ මානව අත්දැකීම් කෙරෙහි අවධානය යොමු කරන ලදී.

මධ්‍යකාලීන යුගය: 5 වන සියවසේ රෝම අධිරාජ්‍යයේ බිඳ වැටීමෙන් පසුව ගත වූ ආසන්න වශයෙන් වසර 1000ක කාල පරිච්ඡේදයක් ලෙස මධ්‍යකාලීන යුගය යන්න පෙළපොතෙහි විස්තර කර ඇත. පෙළපොතෙහි සඳහන් කරන පොදු මතය වනුයේ, යුරෝපයේ මෙම කාල පරිච්ඡේදය ග්‍රීක - රෝම ශිෂ්ටාචාරයේ "සමෘද්ධිමත්" කාල පරිච්ඡේදයෙහි අවසානය සනිටුහන් කළ බවයි. අද වන විට බොහෝ ඉතිහාසඥයින් මෙම යුගය පිළිබඳ මතය අභියෝගයට ලක් කරන බව සඳහන් කිරීම වැදගත් ය. එසේම මෙම සහස්‍රය තුළ සැලකිය යුතු නවෝත්පාදනයන් සහ සංස්කෘතික පොහොසත්කමක් තිබූ බවට ඔවුන් යෝජනා කරයි.

අනුග්‍රහය: කලාකරුවන්ට සහ ශිල්පීන්ට ඔවුන්ගේ වැඩ කටයුතු දිරිමත් කිරීමට සහ අරමුදල් සැපයීමට උපකාර කිරීම.

ප්‍රතිසංස්කරණය: පෙළපොතෙහි ''රෙපරමාදු ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය" ලෙස විස්තර කර ඇති නමුත් නිතර සඳහන් වනුයේ ''ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණ" ලෙස හෝ සරලව ''ප්‍රතිසංස්කරණ" ලෙසයි. මෙය උතුරු යුරෝපයේ ආරම්භ වූ, කතෝලික සභාව ඉලක්ක කර ගනිමින් ප්‍රොතෙස්තන්ත පල්ලිය බිහිවීමට හේතු පාදක වූ ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයයි.

පුනරුදය: නියමානුකූලව මෙය ප්‍රංශ භාෂාවෙන් ''නැවත ඉපදීම" ලෙස පරිවර්තනය කර ඇත. පෙළපොතෙහි සඳහන් වන පරිදි, මෙම යෙදුම සාමාන්‍යයෙන් ග්‍රීක - රෝම ශිෂ්ටාචාරය පිළිබඳ උනන්දුව නැවත පණ ගැන්වීමට සිත යොමු කරවයි.

## iii. උදාහරණ 1: 8 ශ්‍රේණිය, යුරෝපයේ පුනරුදය

8 ශ්‍රේණියේ පෙළපොතෙහි ඇති යුරෝපයේ පුනරුදය පිළිබඳ පරිච්ඡේදයෙන් පුනරුදය ඇති වීමට "දායක වූ සාධක" සහ කලාවේ සිට විද්‍යාව දක්වා විවිධ ක්ෂේත්‍රවල සිදු වූ "පරිවර්තන" පිළිබඳ සාකච්ඡාවක් ඇතුළත් වේ. මෙම පාඩම් ඒකකය හේතුව සහ ප්‍රතිවිපාක පිළිබඳ විවේචනාත්මක චින්තනය පුරුදු කිරීමට හැකි විශිෂ්ට ඒකකයක් බවට පත් කර ගත හැකිය.

**මෙම පරිච්ඡේදය සඳහා භාවිත කිරීමට හැකි හේතු සහ ප්‍රතිවිපාක පිළිබඳ ප්‍රශ්න සඳහා උදාහරණ**

පෙළපොත පමණක් භාවිත කරන ගුරුවරුන්ට, මෙම පරිච්ඡේදයේ දී හේතුව සහ ප්‍රතිවිපාක පිළිබඳ විවේචනාත්මක චින්තනය ප්‍රවර්ධනය කිරීම සඳහා ඉහත සාකච්ඡා කළ ප්‍රශ්න වර්ග හඳුන්වා දීමට අවස්ථාව ඇත. ඒ සඳහා උදාහරණ කිහිපයක් පහතින් දක්වා ඇත:

**අ) අවබෝධය පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්න:**

- කොන්ස්තන්තිනෝපල් නගරය අල්ලා ගැනීම, යුරෝපයෙහි ග්‍රීක-රෝම ශිෂ්ටාචාරයේ නව පණ ගැන්වීමක් ඇති කළේ ඇයි?
- ඔබට මග පෙන්වීම ලෙස 55 (47) පිටුවේ ඇති වගුව භාවිත කරමින්, කලා ශිල්ප කෙරෙහි පුනරුදයේ බලපෑම ඔබ විස්තර කරන්නේ කෙසේද?
- කලාවට අමතරව, යුරෝපයෙහි පුනරුදයේ බලපෑමට ලක් වූ ප්‍රධාන විෂය ක්ෂේත්‍ර මොනවාද?

**ආ) විශ්ලේෂණය සඳහා යොමු කරන, ප්‍රශ්නවලට උදාහරණ:**

- ඉතාලියේ නගරවල ධනවත් පන්තියක් බිහිවීම කලාවේ වෙනස්කම්වලට තුඩු දුන්නේ කෙසේද?
- විශ්වවිද්‍යාල බිහිවීම පුනරුදයේ දිගුකාලීන හෝ කෙටි කාලීන හේතුවක් ලෙස ඔබ වර්ග කරනවාද? එසේ නම් ඇයි?
- තාරකා විද්‍යාවේ සහ වෛද්‍ය විද්‍යාවේ දියුණුව පිළිබඳ දැනුම්වත් වීමට 60-62 (52-54) පිටු කියවන්න. පුනරුද යුගයේ ඇති වූ නවෝත්පාදනයන් මෙම ක්ෂේත්‍රවල දිගුකාලීන වෙනස්කම්වලට තුඩු දුන්නේ කෙසේද? උදාහරණ කිහිපයක් සඳහන් කරන්න.

**ඇ) ඇගයීම සඳහා යොමු කරන, ප්‍රශ්නවලට උදාහරණ:**

- (45-47) පිටුවල යුරෝපයේ 'පුනරුද' යුගයේ ඉස්මතු වීම සඳහා හේතු කිහිපයක් දක්වා ඇත. මේවාට ඇතුළත් වන්නේ:

  - කොන්ස්තන්තිනෝපල් නගරය යටත් වීම
  - ඉතාලියේ නගරවල ධනවත් පන්තියක් බිහි වීම
  - මුද්‍රණ යන්ත්‍රය සොයා ගැනීම
  - විශ්වවිද්‍යාල බිහි වීම
  - ග්‍රීක සහ ලතින් භාෂාවේ යළි පිබිදීම
  - මානවවාදයේ ඉස්මතු වීම

ඔබ මෙම හේතූන් වඩාත්ම වැදගත් හේතුවේ සිට අවම වශයෙන් වැදගත් හේතුව දක්වා ශ්‍රේණිගත කරන්නේ කෙසේද? පෙළපොතෙන් ලැබෙන තොරතුරු භාවිතයෙන් ඔබේ එම තීරණ සාධාරණීකරණය කරන්න.

- තාරකා විද්‍යාවේ හෝ වෛද්‍ය විද්‍යාවේ බලපෑම පුනරුදයට වඩාත් වැදගත් යැයි ඔබ සිතනවාද? එසේ නම් ඇයි?

**ඈ) දෘෂ්ටිකෝණය ගවේෂණය කිරීම සඳහා වූ ප්‍රශ්න:**

- පුනරුදයේ බොහෝ වර්ධනය වීම් කලාව, ගෘහ නිර්මාණ ශිල්පය සහ තාරකා විද්‍යාව වැනි ක්ෂේත්‍රවල සිදු වූ අතර ඒවා නගරවල සිදු විය. මේ වර්ධනය වීම් නිසා වැඩිපුරම පීඩාවට පත්වන්නට ඇතැයි ඔබ සිතන්නේ කුමන සමාජ කණ්ඩායම් ද? අඩුවෙන්ම බලපෑම් ඇති වන්නට ඇත්තේ කුමන කණ්ඩායම්වලටද? හේතුව කුමක් ද?

  *සටහන: ගුරුවරුන්ට මෙම කාලයේ දී යුරෝපීය රටවල සිටි විවිධ සමාජ කණ්ඩායම්, එනම්: බුද්ධිමතුන්, ධනවත් ව්‍යාපාරිකයන්, කලාකරුවන්, වෙළඳුන්, ගොවීන්, කාන්තාවන්, පූජකයන් ආදීන් පිළිබඳ අමතර සන්දර්භීය තොරතුරු සිසුන්ට ලබා දීමට අවශ්‍ය විය හැකිය. ඔබ පෙළපොත පමණක් භාවිත කරනවා වුවත්, මෙම කණ්ඩායම් කිහිපයක් පිළිබඳව පරිච්ඡේදයේ සඳහන් වේ. සඳහන් කර ඇති කණ්ඩායම් (උදා: බුද්ධිමතුන්, ධනවත් පංතිය, කලාකරුවන්, වැදගත් මිනිසුන්) හඳුනා ගැනීමට සිසුන්ට උපකාර කිරීම සහ සඳහන් නොකළ ඔවුන් දන්නා සමාජයේ අනෙකුත් කණ්ඩායම් (උදා: කම්කරු පන්තිය, ගොවීන්, කාන්තාවන්) පිළිබඳවත් සිතීමට යොමු කිරීම ප්‍රමාණවත් විය හැකිය.*

- කතෝලික පල්ලියේ සාමාජිකයන් පුනරුදයේ සහ ප්‍රතිසංස්කරණයේ බලපෑම් ධනාත්මක හෝ සෘණාත්මක ලෙස සලකනු ඇතැයි ඔබ සිතනවාද? ඔබේ පිළිතුර සඳහා සහාය ලෙස පෙළපොතේ ඇති තොරතුරු ආශ්‍රය කර ගන්න.

## iv. උදාහරණ 2: 10 ශ්‍රේණිය, පුනරුදය

මෙම පරිච්ඡේදයෙහි ආරම්භක කොටස්, 8 ශ්‍රේණිය පෙළපොතෙහි ඇති ඒවාට බෙහෙවින් සමාන වන හේතු සාධක කිහිපයක් සහ වෙනස්වීම් සිදු වූ ක්ෂේත්‍ර පිළිබඳ දළ විශ්ලේෂණයකින් සමන්විත වේ. 10 ශ්‍රේණිය පරිච්ඡේදය, දේශපාලන හා ආර්ථික ප්‍රතිවිපාක පිළිබඳ ගවේෂණයකින් මෙන්ම යුරෝපීය පුනරුදයෙන් ශ්‍රී ලංකාවට ඇති කළ බලපෑම පිළිබඳව වූ ගැඹුරු සාකච්ඡාවක් සමඟින් ගොඩනැගී ඇත.

**මෙම පරිච්ඡේදය සඳහා භාවිත කළ හැකි හේතු සහ ප්‍රතිවිපාක පිළිබඳ ප්‍රශ්න සඳහා උදාහරණ**

**අ) අවබෝධය පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්න:**

- පුනරුද සමය තුළ වඩාත් බලවත් වූයේ කුමන සමාජ පන්තියද?
- යුරෝපීයයන් නව වෙළඳ මාර්ග සෙවීමට කොන්ස්තන්තිනෝපලය අල්ලා ගැනීම හේතු වූයේ ඇයි?

**ආ) විශ්ලේෂණය සඳහා යොමු කරන ප්‍රශ්න:**

- වැනිස් සහ ජෙනෝවා වැනි ඉතාලි නගර පුනරුදයේ උපන් ස්ථාන ලෙස සැලකුවේ ඇයි?
- අනෙකුත් මහාද්වීපවල සිදු වූ යුරෝපීය යටත් විජිතකරණයට පුනරුදය දායක වූයේ කෙසේද?
- 9.2 කොටසේ සඳහන් පරිදි පුනරුදය ශ්‍රී ලංකාව කෙරෙහි ඇති කළ බලපෑම් ලැයිස්තුවක් සාදන්න. ඔබ ඒ එක් එක් කරුණු පහත සඳහන් ලෙස වර්ගීකරණය කරන්නේ කෙසේ ද?

  - කෙටි කාලීන ප්‍රතිවිපාකයක් ද? (පුනරුදයෙන් පසු කෙටි කාලයක් පැවති)
  - දිගුකාලීන ප්‍රතිවිපාකයක් ද? (පුනරුදයෙන් පසු බොහෝ කලක් පැවති)
  - සෘජු ප්‍රතිවිපාකයක් ද? (පුනරුදය > ශ්‍රී ලංකාවට කළ බලපෑම)
  - වක්‍ර ප්‍රතිඵලයක්ද? (පුනරුදය > වෙනත් ප්‍රතිවිපාක(ය) > ශ්‍රී ලංකාවට කළ බලපෑම්)
  - අපේක්ෂිත ප්‍රතිවිපාකයක් ද? (ඒ යුගයේ බුද්ධිමතුන්, කලාකරුවන්, විද්‍යාඥයන් බලාපොරොත්තු වූ දෙයක් ද)
  - අනපේක්ෂිත ප්‍රතිවිපාකයක්ද? (පුනරුද චින්තකයින්ගේ ඉලක්කයක් නොවූ දෙයක් ද)

  සටහන: එක් ප්‍රතිවිපාකයක් කාණ්ඩ කිහිපයකට ගැළපිය හැකිය.
  එය එම ගණයට අයත් යැයි ඔබ සිතන්නේ ඇයි?

**ඇ) ඇගයීම සඳහා යොමු කරන ප්‍රශ්න:**

- පුනරුදයේ වැදගත්ම ගෝලීය ප්‍රතිවිපාකය ලෙස ඔබ සිතන්නේ කුමක්ද සහ ඔබ එසේ සිතන්නේ ඇයි?
- යුරෝපයේ ඇතුළත සහ ඉන් පිටත කතෝලික ආගම කෙරෙහි පුනරුදයේ බලපෑම කෙතරම් වැදගත් වූයේද? ඔබගේ පිළිතුරේ දී, පල්ලියේ බලය සහ බලපෑම අඩුවීම පිළිබඳ සාක්ෂි මෙන්ම ආගමේ ව්‍යාප්තිය පිළිබඳ සාක්ෂි කිරා මැන බලන්න.
- පෙළපොතෙහි විස්තර කර ඇති පරිදි ශ්‍රී ලංකාව තුළ යුරෝපීය යටත්විජිතවාදයේ බලපෑමට පුනරුදයේ අදහස් සහ නවෝත්පාදනයන් කෙතරම් දුරට හේතු වී තිබේද? ඔබේ පිළිතුරේ දී, පුනරුද සමය සමඟ සෘජුව පිළිඹිබු වන හෝ එයට සෘජුවම සම්බන්ධ වන බලපෑම් කොපමණ ද යන්න සහ අනෙකුත් සාධක සහ වර්ධනයන් (උදා: කාර්මික විප්ලවය) මගින් කොපමණ බලපෑම් එල්ල වී ඇත්ද යන්න සලකා බලන්න.

**ඈ) දෘෂ්ටිකෝණය ගවේෂණය කිරීම සඳහා වූ ප්‍රශ්න:**

- මධ්‍යකාලීන යුගයේ පොදු අදහස් හා සසඳන විට මානවවාදයේ නැගීම□ මිනිසුන් ලෝකය දෙස බලන ආකාරය වෙනස් කළේ කෙසේද?
- පුනරුදයෙන් වැඩිපුරම ප්‍රතිලාභ ගත් අය සහ කණ්ඩායම් හඳුන්වන්න? අඩුම ප්‍රතිලාභ ලබාගන්නට ඇත්තේ කුමන පුද්ගලයන් සහ කණ්ඩායම් ද?

**ගුරුවරුන්ට පෙළපොතෙන් ඔබ්බට යා හැකි හේතු සහ ප්‍රතිවිපාක පිළිබඳ ප්‍රශ්න සඳහා උදාහරණ**

පෙළපොතෙහි අඩංගු තොරතුරුවලින් ඔබ්බට ගොස් සිසුන්ගේ ඉගෙනීම වැඩිදියුණු කිරීමට උපකාර කිරීම සඳහා අමතර තොරතුරු සහ මූලාශ්‍ර ද්‍රව්‍ය සොයා ගැනීමට ගුරුවරුන්ට හැකි විය යුතුය. උදාහරණයක් ලෙස, EuroClioහි නොමිලේ ලබා දෙන මාර්ගගත (online) තොරතුරු මූලාශ්‍ර සහ Historiana (historiana.eu) හි ගුරුවරුන්ට ප්‍රයෝජනවත් විය හැකි පුනරුද යුගයට අදාළ දෘශ්‍ය මූලාශ්‍ර සහිත මූලාශ්‍ර එකතු කිහිපයක් ඇත.

මෙම මූලාශ්‍ර එකතුවට ඇතුළත් වන්නේ:

Precursors of the Renaissance - පුනරුදයේ පුරෝගාමීන්

Mathematics and Magic - ගණිතය සහ ඇස් බැන්දුම්

Medicine and Anatomy - වෛද්‍ය විද්‍යාව සහ ව්‍යුහ විද්‍යාව

How depictions of The Last Supper changed during the Renaissance - පුනරුද සමයේ දී අවසන් භෝජන සංග්‍රහයේ නිරූපණය පිළිබඳ අදහස වෙනස් වූ ආකාරය

ඇමරිකානු පුනරුද සංගමය - Renaissance Society of America වැනි වෙනත් මාර්ගගත තොරතුරු මූලාශ්‍ර මෙම මාතෘකාව ඉගැන්වීම වැඩි දියුණු කිරීම සඳහා නොමිලේ සපයා දී තිබේ.

Historiana වෙතින් ලබා ගත් අවසන් භෝජන සංග්‍රහය පිළිබඳ තොරතුරු එකතුව භාවිතයෙන් ප්‍රතිවිපාක විශ්ලේෂණය කිරීම සඳහා වූ ප්‍රශ්නයකට උදාහරණය:

මුල් කාලයේ සිට පසුකාලීන පුනරුද සමය දක්වා වන අවසන් භෝජන සංග්‍රහය පිළිබඳව වූ කලා කෘති දෙස බලා, විවිධ රටාවන් සහ ශිල්පීය ක්‍රම පිළිබඳව හොඳින් කියවීමේ යෙදෙන්න. පුනරුදයේ මුල් හා අවසාන කාල පරිච්ඡේද අතර කලාත්මක ශෛලීන්හි ඔබට දැකිය හැකි වෙනස්කම් මොනවාද?

'වෛද්‍ය විද්‍යාව සහ ව්‍යුහ විද්‍යාව' පිළිබඳ තොරතුරු එකතුවෙන් මූලාශ්‍රයක් භාවිත කරමින් කළ හැකි, ප්‍රතිවිපාක විශ්ලේෂණය කිරීම සඳහා වූ ප්‍රශ්නවලට උදාහරණ:



මූලාශ්‍රය: Rembrandt van Rijn, The Anatomy Lesson of Dr Nicolaes Tulp, 1632. Mauritshuis via Europeana, 146.

විස්තරය: පුනරුද සමයේ දී ව්‍යුහ විද්‍යාව පිළිබඳ දැනුමෙහි විශාල ප්‍රගතියක් ඇති වී ඇත. විශ්වවිද්‍යාලවල මළ සිරුරු ඡේදනය කිරීමෙන් ලද දැනුමෙන් බොහෝ දුරට ප්‍රගතියක් ඇති විය. මෙම පිළිවෙත සම්බන්ධයෙන් පැවති පැරණි දුර්මත ක්‍රමයෙන් අඩු වූ අතර කාලයත් සමඟ එය වෛද්‍යවරයෙකුගේ පුහුණුවේ අනිවාර්ය කොටසක් බවට පත් විය. මෙවැනි වෛද්‍ය අධ්‍යයනයන් පුනරුද චිත්‍ර ශිල්පීන් සහ මහජනතාවගේ සිත් ගත්හ. ඇම්ස්ටර්ඩෑම් ශල්‍ය වෛද්‍යවරුන් පින්තාරු කිරීමට රෙම්බ්‍රාන්ඩ්ට පැවරුණේ ඔහුට වයස අවුරුදු විසිපහේ දී ය. 1632 ජනවාරි මාසයේ දී වෛද්‍ය නිකොලස් ටුල්ප් ව්‍යුහ විද්‍යාව පිළිබඳ පාඩමක් කරන අයුරු මෙම සිතුවමෙන් අපට පෙනේ.

**ප්‍රතිවිපාක විශ්ලේෂණය සඳහා වූ ප්‍රශ්න:**

- රූපය දෙස බැලීමෙන් සහ විස්තරය කියවීමෙන්, පුනරුදය විසින් වෛද්‍ය විද්‍යාව හැදෑරීම කෙරෙහි වූ ආකල්ප වෙනස් කළ ආකාරය ගැන මෙම සිතුවම ඇසුරෙන් අපට පැවසිය හැක්කේ කුමක්ද?
- මෙම සිතුවම ඔබේ පෙළපොතෙහි ඇති ලියනාඩෝ ඩාවින්චිගේ කලා කෘති සමඟ සසඳන්න (පිටු 56-57) (48-49). කලාකරුවන් භාවිත කරන ශෛලීන්ගෙ සමාන හා අසමානකම් මොනවා ද? මෙම කලාකරුවන් දෙදෙනා විවිධ කාලවල සහ විවිධ රටවල ජීවත් වූවා නම්, සමානකම් ලෙස පැහැදිලි කළ හැක්කේ කුමක් ද?

**පර්යේෂණ ප්‍රශ්න:**

ඇතැම් පාසල්වල ගුරුවරුන්ට සිසුන් වෙත ප්‍රශ්න යොමු කර, ඒ ඇසුරෙන් ඔවුන්ට තමන්ගේම පර්යේෂණ සිදු කර ප්‍රතිචාර වර්ධනය කර ගත හැකිය. එහිදී මෙවැනි ප්‍රශ්න ඇතුළත් විය හැකිය:

- වර්තමාන ලෝකයට වඩාත්ම වැදගත් බලපෑමක් ඇති කළේ පුනරුද යුගයේ කුමන නවෝත්පාදනය ද?
- පුනරුද සමයේ දී සිදු කළ විද්‍යාත්මක සොයාගැනීම් පිළිබඳ තොරතුරු සන්නිවේදනය කිරීම සීමා කිරීමට පල්ලිය උත්සාහ කළේ කෙසේද?

# 4ආ. මාතෘකාව 2: දේශ ගවේෂණ යුගය

## i. දළ විශ්ලේෂණය

දේශ ගවේෂණ යුගය 8 ශ්‍රේණියේ පාඩම් ඒකකයක් ලෙස ආවරණය කෙරේ. 8 ශ්‍රේණිය පෙළපොතෙහි, 'දේශ ගවේෂණ' යන යෙදුම 'රටවල් සොයා ගැනීමේ අරමුණින් සිදු කරන සෙවීමේ ක්‍රියාව' ලෙස හඳුන්වන අතර, එය 'යුරෝපා ජාතීන් විසින් නව මුහුදු මාර්ග සොයා ගනිමින් එතෙක් හඳුනා නොගත් රටවල් සොයා ගැනීම' ලෙස අර්ථ දැක්වේ. පෙළපොත මුලින්ම මෙම මාතෘකාව පිළිබඳ පසුබිම් තොරතුරු සපයන අතර ඉන් පසුව විවිධ යුරෝපීය බලවතුන් නව රටවල් සොයා දේශ ගවේෂණය සිදු කිරීමට හේතු වූ කරුණු කිහිපයක් පැහැදිලි කරයි. එසේම විවිධ යුරෝපීය රාජ්‍යයන් විසින් අරමුදල් සපයන ලද විශේෂිත දේශ ගවේෂකයන් කෙරෙහි පෙළපොතෙහි මූලික අවධානය යොමු කෙරේ. මූලාශ්‍ර විශ්ලේෂණය සහ වැඩිදුර අධ්‍යයනය සඳහා රූප සටහන්, සිතියම් සහ පින්තූර ඇසුරෙන් අවස්ථා ලබා දේ.

දේශ ගවේෂණ යුගයට පැමිණෙන විට අමතර පසුබිම් තොරතුරු පිළිබඳව ගුරුවරුන් දැනුවත් වීම ප්‍රයෝජනවත් විය හැක. 15 වන සියවස යුරෝපයේ සුවිශේෂී කාලයක් විය. එක් අතකින්, එය නිමක් නැති ව්‍යසනයක් පැවති කාලයක් විය: කළු මරණවලින් නිතිපතා විශාල නගර විනාශ වුණි; ඇතැම් ස්ථානවල ආර්ථිකය මන්දගාමී වූ අතර තවත් සමහර ස්ථානවල ආර්ථිකය සම්පූර්ණයෙන්ම කඩා වැටුණි; මුළු නගරම බංකොලොත් විය; එසේම නයිට්වරුන්ගේ පැළැන්තිය රණ්ඩු දබර කරමින් ඔවුන්ගේ යුද්ධවලින් ගම්බිම් විනාශ කළහ. කෙසේ වෙතත්, අනෙක් අතට, මෙම ව්‍යසනවලින් බේරීමට සමත් වූවන් පෙර නොවූ විරූ නිදහසක් භුක්ති විඳිනු ලැබීය: විශාල ප්‍රමාණයක මරණ, යුරෝපය පුරා මහජන නැගිටීම්වලට තුඩු දුන් ගොවීන් ඉඩම්වලට බැඳ තැබීමට උත්සාහ කරන ලද නීතිවලට හේතු විය. එසේම 'උපතින් පහත් යැයි සැලකූ' මිනිසුන් සේද ඇඳීම නතර කිරීමට සහ ඔවුන්ගේ උත්සව දින සීමා කිරීමට සමහර ස්ථානවල නීති සම්මත කර තිබූ අතර සාමාන්‍ය මිනිසුන්ට සේද රෙදි වැනි සුඛෝපභෝගී දේ ලබා ගැනීමට ඇති ඉඩකඩෙහි තරම සහ කෙත්වල වෙහෙස මහන්සි වී වැඩ කිරීමට ඇති කාලය එයින් පෙන්නුම් කෙරිණි.

යුරෝපයේ මෙම සුවිශේෂී කාලයෙන් ද අදහස් කරනු ලැබුවේ, විශාල පිරිසකට යුරෝපයෙන් පිටව ගොස් විදේශ රටවල් සොයා දේශ ගවේෂණය කිරීමට තිබූ බලවත් ආශාව පිළිබඳවයි. විශේෂයෙන්ම, ඔවුන් තම සමාජ තත්ත්වය වැඩි කර ගැනීමේ උත්සාහයක් ලෙස මුදල් වැඩි වැඩියෙන් උපයා ගැනීම සඳහා කුළුබඩු, වටිනා ලෝහ සහ ස්ථාන සෙවීය. ආණ්ඩු තමන්ගේ දේශපාලන සහ ආර්ථික බලය වැඩි කර ගැනීම සඳහා එවැනි උත්සහයන් දිරිමත් කිරීමට නැඹුරු විය.

## ii. මූලික පාරිභාෂිත වචන

අනුග්‍රහය: දේශ ගවේෂණ යුගයේ දී දේශ ගවේෂකයන්ට රජයක් විසින් ලබා දෙන සහාය

සේද මාවත : ආසියාව, මැද පෙරදිග සහ යුරෝපය සම්බන්ධ කළ වෙළඳ මාර්ග සමූහයක්

## ii. උදාහරණ 1: 8 ශ්‍රේණිය, දේශ ගවේෂණ හා යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීම

8 ශ්‍රේණිය පෙළපොතේ දේශ ගවේෂණ හා යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීම යන පරිච්ඡේදයේ යුරෝපා ජාතීන්ගේ ''දේශ ගවේෂණවලට බලපෑ හේතු", සමහර ප්‍රධාන දේශ ගවේෂණ සහ එම දේශ ගවේෂණවලින් කීර්තියට පත් වූ ප්‍රධාන පුද්ගලයින්ගේ විස්තර පිළිබඳ සාකච්ඡාවක් ඇතුළත් වේ. හේතුව සහ ප්‍රතිවිපාක පිළිබඳ විවේචනාත්මක චින්තනය වැඩි දියුණු කිරීම සඳහා වූ ප්‍රශ්නවලට විවිධ උදාහරණ කිහිපයක් පහතින් විස්තර කෙරේ.

**මෙම පරිච්ඡේදය සඳහා භාවිත කිරීමට හැකි හේතු සහ ප්‍රතිවිපාක පිළිබඳ ප්‍රශ්න සඳහා උදාහරණ**

පෙළපොත පමණක් භාවිත කරන ගුරුවරුන්ට, මෙම පරිච්ඡේදයේ දී හේතුව සහ ප්‍රතිවිපාක පිළිබඳ විවේචනාත්මක චින්තනය වැඩි දියුණු කිරීම සඳහා ඉහත සාකච්ඡා කළ ප්‍රශ්න වර්ග හඳුන්වා දීමට අවස්ථා ඇත. ඒ සඳහා උදාහරණ කිහිපයක් පහතින් දක්වා ඇත:

**අ) අවබෝධය පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්න:**

- යුරෝපීයයන්ට වෙනත් මහාද්වීප පිළිබඳ සීමිත දැනුමක් පමණක් තිබුණේ ඇයි?
- වෙළඳාම හේතු කොට ගෙන මධ්‍යධරණී මුහුද අවට තිබූ වාණිජ නගර මොනවාද?
- මම කාලයේ දී ආසියාව සහ යුරෝපය අතර තිබූ ප්‍රධාන වෙළෙඳ මාර්ග තුන මොනවාද?
- මෙම කාලයේ දී යුරෝපීයයන්ට වෙනත් මහාද්වීප දේශ ගවේෂණය කිරීමට හැකි වූ ප්‍රධාන සාධක මොනවාද?
- මෙම කාලයේ දී දේශ ගවේෂණ සඳහා පෙරමුණ ගනු ලැබුවේ යුරෝපයේ කුමන රටවල් ද?

**ආ) විශ්ලේෂණය සඳහා යොමු කරන ප්‍රශ්න:**

- යුරෝපා ජාතීන්ගේ වෙළඳාමට සහ දේශ ගවේෂණයට කොන්ස්තන්තිනෝපලය යටත් කර ගැනීම බලපෑවේ කෙසේද?
- විද්‍යාත්මක සොයා ගැනීම් සහ නවෝත්පාදන යුරෝපීය දේශ ගවේෂණයට බලපෑවේ කෙසේද?
- (57) පිටුවේ සිතියම 4.1අධ්‍යනය කරන්න. කොන්ස්තන්තිනෝපලය යටත් කර ගැනීමෙන් එම වෙළඳ මාර්ගවලට ප්‍රවේශ වීම අවහිර කළේ නම්, යුරෝපීයයන්ට ආසියාවට ළඟා වීමට අවශ්‍ය වූ විටක ඔවුන්ට තිබූ විකල්ප මොනවාද?
- රජයන් විසින් දේශ ගවේෂණයේ අවධානම දැන දැනම දේශ ගවේෂකයන්ට අනුග්‍රහය ලබා දුන්නේ ඇයි?

**ඇ) ඇගයීම සඳහා යොමු කරන ප්‍රශ්න:**

- මෙම කාලයේ යුරෝපා ජාතීන්ට වෙනත් මහාද්වීප දේශ ගවේෂණය කිරීමට හැකි වූ වැදගත්ම සාධකය ලෙස ඔබ සිතන්නේ කුමක්ද? එය වැදගත්ම සාධකය යැයි ඔබ සිතන්නේ ඇයි?
- දේශ ගවේෂණ යුගයේ දී ඒ සඳහා වඩාත්ම වැදගත් දායකත්වය ලබා දුන්නේ කුමන දේශ ගවේෂකයා ද සහ ඔබ එසේ හඳුන්වන්නේ ඇයි?

**ඈ) දෘෂ්ටිකෝණය ගවේෂණය කිරීම සඳහා වූ ප්‍රශ්න:**

- දේශ ගවේෂණ යුගයෙන් ප්‍රතිලාභ ලැබූ (එනම් වඩා යහපතක් ඉතිරි වූ) පුද්ගලයන් හෝ පුද්ගල කණ්ඩායම් මොනවාද? ඔබ එසේ හඳුන්වන්නේ ඇයි?
- දේශ ගවේෂණ යුගය අයහපත් ලෙස බලපෑවේ කුමන පුද්ගලයන්ට හෝ පුද්ගල කණ්ඩායම්වලටද? එසේ හඳුන්වන්නේ ඇයි?
- එකල යුරෝපීය දේශ ගවේෂණ අදහසට අනුබල දෙන්නට ඇත්තේ කවුරුන්ද? එකල මෙම අදහසට විරුද්ධ වෙන්න ඇත්තේ කවුරුන් ද? එසේ වූයේ ඇයි?

## iii. උදාහරණ 2: 10 ශ්‍රේණිය, ශ්‍රී ලංකාව හා බටහිර ලෝකය

10 ශ්‍රේණිය පෙළ පොතේ ශ්‍රී ලංකාව හා බටහිර ලෝකය යන පරිච්ඡේදයේ පෘතුගීසීන් සහ ලන්දේසීන් ශ්‍රී ලංකාවට පැමිණීමේ බලපෑම පිළිබඳ සාකච්ඡාවක් ඇතුළත් වේ. පරිච්ඡේදයේ වැඩි කොටසක් වෙන් කර ඇත්තේ පෘතුගීසීන්ට එකල ශ්‍රී ලංකාවේ විවිධ රාජධානි තුළ තම බලය තහවුරු කර ගැනීමට හැකි වූ විශේෂිත දේශපාලන තත්ත්වයන් පිළිබඳ සවිස්තරාත්මක විස්තර කිරීම සඳහා ය. හේතුව සහ ප්‍රතිවිපාක පිළිබඳ විවේචනාත්මක චින්තනය වැඩි දියුණු කිරීම සඳහා වූ ප්‍රශ්නවලට විවිධ උදාහරණ කිහිපයක් පහතින් විස්තර කෙරේ.

**මෙම පරිච්ඡේදය සඳහා භාවිත කිරීමට හැකි හේතු සහ ප්‍රතිවිපාක පිළිබඳ ප්‍රශ්න සඳහා උදාහරණ**

පෙළපොත පමණක් භාවිත කරන ගුරුවරුන්ට, මෙම පරිච්ඡේදයේ දී හේතුව සහ ප්‍රතිවිපාක පිළිබඳ විවේචනාත්මක චින්තනය වැඩි දියුණු කිරීම සඳහා ඉහත සාකච්ඡා කළ ප්‍රශ්න වර්ග හඳුන්වා දීමට අවස්ථා ඇත. ඒ සඳහා උදාහරණ කිහිපයක් පහතින් දක්වා ඇත:

**අ) අවබෝධය පරීක්ෂා කිරීමට සඳහා වූ ප්‍රශ්න:**

- ආසියාව සහ යුරෝපය අතර තිබූ ප්‍රධාන වෙළෙඳ මාර්ග තුන මොනවාද?
- දේශ ගවේෂණ යුගයේ දී වස්කෝ ද ගාමා ඉටු කළ වැදගත් කාර්යභාරය කුමක්ද?
- පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණීමට උනන්දු වූයේ කුමක් නිසාද?
- පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණෙන විට රාජධානි කීයක් තිබුණි ද?
- 1638 උඩරට ලන්දේසි ගිවිසුමේ මූලික කරුණු මොනවාද?

**ආ) විශ්ලේෂණය සඳහා යොමු කරන ප්‍රශ්න:**

- එකල රට තුළ පැවති දේශපාලන බෙදීම්, පෘතුගීසීන් ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්ත වීමට බලපෑවේ කෙසේද?
- ශ්‍රී ලංකාවේ අභ්‍යන්තරයට ව්‍යාප්ත වීමට පෘතුගීසින් දැරූ උත්සාහයන් අසාර්ථක වූයේ ඇයි?
- පෘතුගීසීන් හා කෝට්ටේ රාජධානිය අතර පැවති සන්ධානයේ කෙටිකාලීන ප්‍රතිවිපාක මොනවාද? මෙම සන්ධානයේ දිගුකාලීන ප්‍රතිවිපාක මොනවාද?
- උඩරට රාජධානිය පෘතුගීසීන්ට එරෙහිව ප්‍රතිරෝධය දැක්වීමේ ප්‍රයත්න ලෙස කළ සටන්වල කෙටිකාලීන ප්‍රතිවිපාක මොනවාද?
- උඩරට රාජධානිය සහ ලන්දේසීන් අතර ඇති කරගත් මිත්‍රත්වයේ දිගුකාලීන ප්‍රතිඵල මොනවාද?

**ඇ) ඇගයීම සඳහා යොමු කරන ප්‍රශ්න:**

- පෘතුගීසීන්ට උඩරට රාජධානිය අල්ලා ගැනීමට නොහැකි වීම කෙරෙහි බලපෑ වැදගත්ම සාධකය
- කුමක්ද?
- උඩරට රාජධානියේ ප්‍රතිරෝධය විදහා දැක්වීමේ දී වඩාත් වැදගත් වූ සටන කුමක්ද?
  කෝට්ටේ රාජධානිය පෘතුගීසීන් සමඟ මිත්‍ර වීමට ගත් උත්සාහය සාධාරණද? එසේ නම් ඇයි සහ
- නොඑසේ නම් ඇයි?
  දෙවන රාජසිංහ රජු ලන්දේසීන්ගේ සහය තමා වෙත ලබා ගැනීම සාධාරණ යැයි ඔබ සිතනවාද? එසේ
- නම් ඇයි සහ නොඑසේ නම් ඇයි?
  ඔබ සිතන පරිදි පෘතුගීසීන් සහ ලන්දේසීන් උඩරට රාජධානියට එරෙහිව එක්ව ක්‍රියාත්මක නොවීමට තීරණය කළේ ඇයි?

**ඈ) දෘෂ්ටිකෝණය ගවේෂණය කිරීම සඳහා වූ ප්‍රශ්න:**


- පෘතුගීසීන්ට සහ ඉන් පසුව ලන්දේසීන්ට ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්ත වීමට සහාය දැක්වූයේ කුමන පුද්ගලයන් හෝ පුද්ගල කණ්ඩායම්ද? ඔවුන් එසේ සිදු කළේ ඇයි?
- පෘතුගීසීන් සහ ඉන් පසුව ලන්දේසීන් ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්ත වීමට විරුද්ධ වූයේ කුමන පුද්ගලයන් හෝ පුද්ගල කණ්ඩායම්ද? ඔවුන් එසේ සිදු කළේ ඇයි?
- ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්ත වීම පිළිබඳ පෘතුගීසීන්ට පැවති අපේක්ෂාව, ලන්දේසි ව්‍යාප්තියට වඩා වෙනස් වන්නට ඇත්තේ කෙසේද? ඔවුන්ට එකම අපේක්ෂාවන් තිබිය හැකිද නැද්ද යන්න සලකා බලන්න.
- දේශ ගවේෂණ යුගයේ දී පෘතුගීසි සහ ලන්දේසි ව්‍යාප්තිය පිළිබඳ මිනිසුන්ගේ දෘෂ්ටිකෝණය කාලයත් සමඟ වෙනස් වී ඇත්තේ කෙසේද?

**ගුරුවරුන්ට පෙළපොතෙන් ඔබ්බට යා හැකි හේතු සහ ප්‍රතිවිපාක පිළිබඳ ප්‍රශ්න සඳහා උදාහරණ**

පෙළපොතෙහි අඩංගු තොරතුරුවලින් ඔබ්බට ගොස් සිසුන්ගේ ඉගෙනීම වැඩිදියුණු කිරීමට උපකාර කිරීම සඳහා අමතර තොරතුරු සහ මූලාශ්‍ර ද්‍රව්‍ය සොයා ගැනීමට ගුරුවරුන්ට හැකි විය යුතුය.

වස්කෝ ද ගාමා පළමුව ඉන්දියාවට ගිය ගමනේ සිතියම් මූලාශ්‍රය භාවිතයෙන් ප්‍රශ්න කිරීමේ උදාහරණ:

සිතියම් මූලාශ්‍රය (Britannica.com වෙතින්):




විස්තරය: කේප් ඔෆ් ගුඩ් හෝප් සහ ඉන්දියාව වෙත ළඟා වී නැවත යුරෝපයට ගමන් කිරීමට උත්සාහ කිරීමේ දී, පෘතුගීසීන්ට ඔවුන්ගේ, ගැඹුරු මුහුදේ සුළං බලයෙන් ක්‍රියාත්මක වන රුවල් නැව් යාත්‍රා කිරීමේ දී විශේෂිත රුවල් යාත්‍රා ශිල්පීය ක්‍රම මත විශ්වාසය තැබීමට සිදු විය. ඉන්දියන් සාගරයේ සුළං රටා තීරණය වන්නේ මෝසම් මගින් නිසා ඒවා පිළිබඳව අනාවැකි පළ කළ හැකි බව දේශ ගවේෂකයන් සහ වෙළඳුන් බොහෝ කලක සිට දැන සිටියහ. නිදසුනක් වශයෙන්, නාවිකයින්ට ගිනිකොනදිග ආසියාවේ සිට නිරිතදිග ආසියාවට සහ තවදුරටත් අප්‍රිකාවට සැරිසැරීමට දෙසැම්බර් සිට මාර්තු දක්වා ඊසානදිග මෝසම් භාවිත කළ හැකිය. මීට අමතරව, නාවිකයින්ට අප්‍රිකාවේ සහ නිරිතදිග ආසියාවේ සිට ගිනිකොනදිග ආසියාවට යාත්‍රා කිරීමට මැයි සිට ඔක්තෝබර් දක්වා නිරිතදිග මෝසම් භාවිත කළ හැකිය. කෙසේ වෙතත්, උතුරු අත්ලාන්තික් සහ දකුණු අත්ලාන්තික් සාගරයේ ඇති එකතැන කැරකෙන දියවැල් (Gyre systems) නිසා අත්ලාන්තික් සාගරය පිළිබඳව දේශ ගවේෂකයන්ට කලින් අනාවැකි පල කළ නොහැකි ලෙස පෙනෙන්නට විය.

අත්ලාන්තික් සාගරයේ සැරිසැරීමට අවශ්‍ය තාක්ෂණය සොයාගත් පළමු යුරෝපීය බලවතා පෘතුගීසීන් ය. ඔවුන් මෙම තාක්ෂණය හැඳින්වූයේ ''ඩදකවී ාද ප්ර" ලෙසයි, එහි අදහස වූයේ මුහුදෙන් නැවත පැමිණීම යන්නයි. මෙම තාක්ෂණය පහත පරිදි ක්‍රියාත්මක විය: උතුරු අත්ලාන්තික් සාගරයේ සිටින විට, දේශ ගවේෂකයන්ට අප්‍රිකානු වෙරළ දිගේ (යුරෝපයේ සිට කේප් වර්ඩ් දූපත් දක්වා) දකුණට යාමට සෘජු චාරිකාවක සැරිසැරීමට සිදු වූ අතර පසුව යුරෝපයට ආපසු යාමට බටහිර දෙසට (අසෝර්ස් හරහා) ගමන් කිරීමට සිදු විය. කෙසේ වෙතත්, දකුණු අත්ලාන්තික් සාගරයේ සිටින විට, දේශ ගවේෂකයන්ට අප්‍රිකාවේ දකුණු දෙසට (කේප් වර්ඩ් දූපත් සිට ශාන්ත හෙලේනා හරහා කේප් ඔෆ් ගුඩ් හෝප් දක්වා) තවදුරටත් බටහිර දෙසට ගමන් කිරීමට සිදු වූ අතර පසුව උතුරු අත්ලාන්තික් සාගරයට සෘජු ගමනක් යාමට සිදු විය. මෙම ක්‍රමය සොයාගත් පළමු යුරෝපීයයා වූයේ පෘතුගීසි ගවේෂක බර්ටොලමියු ඩයස් ය, ඔහු 1488 දී කේප් ඔෆ් ගුඩ් හෝප් වෙත ගොස් නැවත යුරෝපයට පැමිණියේ ය. ඉන් පසුව අනෙකුත් පෘතුගීසි දේශ ගවේෂකයින් සහ පසුව අනෙකුත් යුරෝපා ජාතිකයන් මෙම තාක්ෂණය අනුගමනය කළහ.

**ප්‍රශ්න:**

- "volta do mar" තාක්ෂණය ඔබේම වචනවලින් පැහැදිලි කරන්න.
- අත්ලාන්තික් සාගරයේ සහ ඉන්දියන් සාගරවල යාත්‍රා කිරීම සඳහා නාවිකයන්ට විවිධ උපාය මාර්ග දෙකක් අවශ්‍ය වූයේ ඇයි?
- වාස්කෝ ද ගාමාගේ පළමු මුහුදු ගමනේ සිතියම් මූලාශ්‍රය, "volta do mar" තාක්ෂණය භාවිත කළ අයුරු පෙන්වන්නේ කෙසේද?
- ආසියාව තුළ යුරෝපීයන්ගේ ව්‍යාප්තියේ දී "volta do mar" තාක්ෂණය සොයා ගැනීම කොතරම් දුරට වැදගත්ද වූයේ ද?

**අමතර තොරතුරු මූලාශ්‍ර:**

- Europe and the Age of Exploration - යුරෝපය සහ දේශ ගවේෂණ යුගය
- Digital Primary Sources of Age of Exploration දේශ ගවේෂණ යුගයේ ප්‍රාථමික ඩිජිටල් මූලාශ්‍ර
- Digital Units and Exhibits of Age of Exploration දේශ ගවේෂණ යුගයේ ඩිජිටල් ඒකක සහ ප්‍රදර්ශන භාණ්ඩ

**පර්යේෂණාත්මක ප්‍රශ්න:**

- ඉන්දියාවේ සිට නැගෙනහිර අප්‍රිකාවට ආපසු පැමිණීමට වඩා (දින 95 ක් ගත වූ) වස්කෝ ද ගාමාගේ කැලිකට් ගමන (දින 20 ක් පමණක් ගත විය) කෙටි වූයේ ඇයි?
- දේශ ගවේෂකයන්ගේ දේශ ගවේෂණ අවසන් වූ පසු ඔවුන්ගේ ජීවිත කෙබඳු වූයේ ද? ඔවුන් විශ්‍රාම ගියේ ද? ඔවුන් ඔවුන්ගේ දේශ ගවේෂණ පිළිබඳව කතන්දර ලියා තිබේද?